**2019/09/10 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව**

2019/09/10 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 21. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 01. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |

## 01. ආගම සිහි කිරීම

2019.09.10 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින්, 2019 සැප්තැම්බර් මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. පෙර සභාවල පරිදිම ඔබ සියළු දෙනාගේ සහයෝගය මම ඉතා ගෞරවයෙන් අපේක්ෂා කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් වෙනත් කරුණු යටතේ සභාවේ පාරක් ලෙස පවරා දෙන මෙන් ඉල්ලීම් කරන ලද මාර්ගය, වසන්ත ගනේවත්ත මහතාගේ නිවස අසළ සිට පඹගොඩවතුරාව දක්වා යනුවෙන් වාර්තාවේ සටහන් වුවද, එය වසන්ත ගනේවත්ත මහතාගේ නිවස අසළ සිට හම්බුවවත්ත පාර ලෙස නිවැරදි විය යුතු බව ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් පෙන්වා දෙන ලදී.

**(අ)02. 2019.08.13 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2019.08.13 දින පැවති මහා සභාවේ සභා වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව, සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. දකුණු පළාත් සංවර්ධන සැළැස්ම - 2019 උපමාන පාදක සංවර්ධන ප්‍රදාන, පසුගාමී පළාත් පාලන ආයතන බල ප්‍රදේශ සඳහා වූ විශේෂ වැඩසටහන නාන තොටුපළ සංවර්ධන යෝජනා අනුමත කරන ලද, පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ලද අංක 3/5/1/6/1 සහ 2019.09.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. ගම් පෙරළිය - 2019 මාර්ග සංවර්ධනය කිරීම යන මැයෙන් ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලය මගින් යොමු කරන ලද අංක NAG/GEV/3/VI/Gamperaliya – (2019) සහ 2019.08.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

03. ඉදිරි වර්ෂය සඳහා සංවර්ධන යෝජනා ලබා ගැනීම යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ලද අංක 3/1/1/50 සහ 2019.08.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ යෝජනා මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා ඇති බවත්, 2019.09.12 දින වන විට එම යෝජනා ලබාදීමට කටයුතු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

04. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් යොමු කරන ලද 2019.07.19 දින පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී.

05. කැටගොඩ උඩුගම සෞඛ්‍ය මධ්‍යස්ථානය අබලන් තත්වයේ පැවතීම නිසා සායන පැවැත්වීමේ අපහසුව දන්වා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය , උඩුගම විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තමාට දුරකථනයෙන් කතා කර දැන්වූ බවත්, ලිඛිතව එවන මෙන් ඔහු දැනුවත් කල බවත්ය.

මේ කටයුත්ත අපට කර ගත නොහැකි බැවින්, මේ සඳහා ප්‍රතිපාදන ඉල්ලීම් කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

06. පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතවරුන් සඳහා වන සහතිකපත්‍ර පාඨමාලාව- 2019 දකුණු පළාත මැයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් යොමු කරන ලද අංක SLILG/Cert/2019/Sou සහ 2019.08.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම පුහුණුව ඉතා වැදගත් බැවින් මේ සඳහා කැමති මහජන නියෝජිතයින් තිදෙනකුට සහභාගී විය හැකි බව ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලදී.

07. නාගොඩ ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කැබැල්ලක් ලබා ගැනීම සම්බන්ධව සිතිජ සුහසාධක සංගමය, නාගොඩ විසින් යොමු කරන ලද  ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව දුරකථනයෙන් කතා කල බවත්, එහිදී, වාචිකව මෙම ඉල්ලීම ඉටුකිරීම කල නොහැකි බවත්, නමුත් සභාවේ මතය විමසීම සඳහා ලිපියක් මගින් ඉල්ලීම් කරන ලෙසට දැනුම් දුන් බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

08. හෝමදොල නෙලුවැල් මූකලාන ගම ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් යොමු කරන ලද 2019.08.21 දිනැති ලිපිය සභාගත කරන ලදී.

09. දානමය පිංකමක් සඳහා ඇරයුම් කරමින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ සේවක පිරිස විසින් යොමු කරන ලද 2019.09.04 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම පුන්‍ය කටයුත්ත අපේ සභාව මගින් සිදු කල  යුතු එකක් බවත්, අපේ සේවක පිරිස උප කාර්යාලයේ මෙම පිංකම සිදු කිරීමට සූදානම් කර ඇති බැවින්,  ඒ සඳහා අපෙන් විය යුතු යුතුකම් ඉටු කරමු යනුවෙන් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

10. සමෘද්ධි සහනාධාරය අසාධාරණ අයුරින් අහිමි වී යාම සම්බන්ධව 213 පරණතානායම්ගොඩ, 213 A පරණතානායම්ගොඩ සහ 213 B පරණතානායම්ගොඩ ග්‍රාම සේවා  වසම්වල ගම්වාසීන් කිහිප දෙනෙකුගේ අත්සනින් යුතු පෙත්සම සමඟ ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යොමු කරන ලද 2019.08.25 දිනැති  ලිපිය සභාගත කරන ලදී.

මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග සඳහා මෙම පෙත්සම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කරන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

11. ගෝණදෙනිය ක්‍රීඩා පිටිය සම්බන්ධ නඩුව පිළිබඳව 2019.09.04 දින පැවති සාකච්ඡාවට අදාළ විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කරන ලද ලුහුඬු වාර්තාව සභාගත කරන ලදී.

**ගරු සභාපතිතුමා පැහැදිලි කරමින්,**

ඒ පිළිබඳව පසුගියදා අපි සාකච්ඡාවක යෙදුනා. ඔබතුමාල කවුරුත් දන්නවා තරංගා ලියනාරච්චි නීතිඥ තුමිය අපට සිතාසියක් එවලා තියෙනවා. ගියවර මම ඒ සම්බන්ධව සභාව දැනුවත් කළා. ඒ සම්බන්ධව අපි ප්‍රාදේශීය ලේකම්ට 30 වෙනිදා ලියුමක් ඉදිරිපත් කළා. මේ නඩුව පිළිබඳ සාකච්ඡාවක් ඉල්ලලා හතරවෙනිදා තමයි කැඳෙව්වෙ. එදාට එන්න කියලා ආනන්ද පද්මසිරි මහත්මයටත් ලිපියක් යැව්වා. අපේ මන්ත්‍රීවරු දැනුවත් කළා. ඒ අනුව එදා ඒ සාකච්ඡාවට සහභාගි වුණේ මමත්, දිසාපතිතුමියත්, ග්‍රාම නිලධාතුමියත්, ආනන්ද පද්මසිරි කාරියවසම් මහතා සහ යුරේකා මල්කාන්ති මහත්මියත් පමණයි. ඉල්ලීම් කරන පාර පෙන්වාදීමට මැනුමක් සිදුකිරීමට ඒකෙදි සාකච්ඡා වුණා. අවසානයේ උප සභාපතිතුමාද සාකච්ඡාවට සහභාගි වුණා. මෙම ගෝනදෙනිය ක්‍රීඩාපිටිය පිහිටි ඉඩම සම්බන්ධව ලේඛන පිටපත් ලබා ගැනීම සඳහා අපි ප්‍රාදේශීය ලේකම්ට ලියුමක් යවලා තියෙනවා. සභාව සතුව මේ සම්බන්ධ ලේඛන නැහැ. සාකච්ඡාව අවසානයේ ස්ථානීය පරීක්ෂණයට දිසාපතිතුමිය සහ අදාළ නිලධාරීන් සමඟ මමද සහභාගි විය. එහිදී පාර ලබාදීමට අවශ්‍ය මැණුම් කටයුතු ඉදිරියේදී සිදු කිරීමටත්, ඉදිරි විසඳුම්වලට උසාවි මගින් කටයුතු කිරීමටත් තීරණය කරන ලදී.

**ගරු උප සභාපතිතුමා පැහැදිළි කරමින්,**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, ඒ පිළිබඳ කරුණු පැහැදිලි කිරීමක් කරන්නම්. ගෝනදෙනිය ක්‍රීඩාපිටියට තියෙන්නේ පර්චස් 61 යි. ක්‍රීඩා පිටියෙන් ආනන්ද පද්මසිරි කාරියවසම් මැතිතුමාට පර්චස් 72 ක පාරක් තියෙන බව Plan එකෙයි, ඔප්පුවෙයි සඳහන් වෙනවා. ඒ කියන්නේ පිට්ටනිය අක්කර ½කුත් නැහැ. එතකොට පිට්ටනියෙන් ½ ක් එතුමගෙ ඉඩමට යනවා. එතුමගේ ඉඩම අක්කරයකුත්, රූඩ් ගානක් තියෙනවා. පෙරපාසල් බිත්තිය ළඟටම ඉඩම තියෙනවා. පෙරපාසලේ බුදු පිළිමයක් තියෙනවා එතැනටම පාර තියෙනවා. එතකොට ගේට්ටු, ළමා උයන් ඔක්කොම එතුමගෙ ඉඩමට යනවා. දැන් එතුමා ප්‍රාදේශීය සභාව සම්බන්ධ කර ගත්තා. අපිත් එක්ක නඩු කියන්න. දැන් බැලුවම මේක අපට අයිති පිට්ටනියක් නෙවෙයි. රජයේ ඉඩමක් තමයි. මේ ක්‍රමානුකූලව ඒකට මැදිහත් වෙච්ච මන්ත්‍රීවරු, සභාපතිවරුන් සංවර්ධනය කරලා තියෙන්නේ. රජයේ ඉඩමක් සංවර්ධනය කරනකොට පත්මසිරි මහත්මයා රජයට මුදල් දීලා මේ ඉඩම ගත්තෙ අවුරුදු හත අටකට කලින්. එතුමා ඒ වෙලාවේ ඒවා එළි පෙහෙළි කරන්න, මායිම් සුද්ද කරන්න ගියෙ නැහැ. අපේ කට්ටිය පස් කපලා පිට්ටනිය සංවර්ධනය කළා. පිට්ටනිය ගොඩ කලා. එතුමාගේ භූමිභාගයත් පස් කපලා පිට්ටනිය ගොඩ කළා. ඒ වෙලාවේ නිශ්ශබ්දව ඉදලා, දැන් නඩුවක් දැම්මා. සභාපතිතුමාට දැන් එන්තරවාසියක් එවලා තියෙනවා. නඩු දිනයට කළින් මේකට මැදිහත් වෙලා, එකගතාවයක් කරගන්නවා නම් කරගන්න කියලා ගිය සභාවේදී මන්ත්‍රීවරු තීරණය කළා. සාකච්ඡාවකට යන්න කියලා, තරංග මන්ත්‍රීතුමයි, ධනංජය මන්ත්‍රීතුමයි, අරුණ ශාන්ති මන්ත්‍රීතුමියයි ගමේ මන්ත්‍රීවරු වශයෙනුත්, සභාපතිතුමයි, මමයි, අජිත් එඩේරආරච්චි හිටපු සභාපතිතුමයි, සහබන්දු මහතාගේ කාලයේත් මේක සංවර්ධනය කළ නිසා, සහබන්දු මහත්මයත් හිටපු සභාපතිවරයෙක් වශයෙන් සම්බන්ධ වුණා. දැනට සුමාන දෙකකට කලින් ආනන්ද පද්මසිරි මහතා සහ අපි කැඳවලා සභාපතිතුමා සාකච්ඡා කළා. එතුමා ආවට පස්සෙ අපට ඉදිරිපත් කරන්න ලිපි ලේඛන නැහැ. අපි කිව්වා සංවර්ධනය කලාට, ජනතාව ප්‍රයෝජනය ගත්තට, මේක අපිට අයිති ඉඩමක් නෙවෙයි. මේක අයිති ප්‍රාදේශීය ලේකම්ට. අපි සාකච්ඡාවකට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යමු කියලා, දැන් සුමානයකට කලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සාකච්ඡාවට ගියා. නමුත් තරංග මන්ත්‍රීතුමා, ධනංජය මන්ත්‍රිතුමා, අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය ආරාධනා කලාට ආවෙ නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයේ මේකෙ ප්ලෑන් එක, බිම් ප්‍රමාණය, ඔක්කොම තියෙනවා. ඒ ලියකියවිලි, ආනන්ද පද්මසිරි මහත්මයා ඉදිරිපත් කරපු පිඹුරුපත් සමඟ සැසඳෙනවා. ආනන්ද පද්මසිරි මහත්මයා ඉල්ලීම් කරන්නේ එයාගෙන් කැපිච්ච බිම් ප්‍රමාණය, සෞඛ්‍ය මධ්‍යස්ථානය ළඟ තියෙන ඉඩ ප්‍රමාණයෙන් දෙන්න කියලා. ප්‍රාදේශීය ලේකම්ට එහෙම

දෙන්න බැහැ. ප්‍රාදේශීය ලේකම් ඒකට එකඟ වුණේ නැහැ. ආනන්ද පද්මසිරි මහත්මයා කියනවා මට පාරට පර්චස් 72 ක් තියෙනවා. මට අඩි 30 ක පාරක් ඕන කියලා. කණ්ඩිය අයිනෙන් ප්ලෑන් එකේ පාර තියෙන්නේ. එතනින් පාර දුන්නොත් පිට්ටනියෙ ක්‍රීඩා කරන්න හැකියාව ලැබෙන එකක් නැහැ. අඩි තිහක විතර පාරක් දෙන විට, ක්‍රීඩාපිටියක් ඉතුරු වෙන්නේ නැහැ. ඉතින් අපි කිව්වා එතනින් පාර නැතුව පල්ලෙහා මායිමේ කුඹුරෙන් පාර දෙන්නම් කියලා. ඒ පාර පෙර පාසලට යාම සඳහා එක සැරයක් සංවර්ධනය කළා. ඒක දැන් කැලෑ වැවිලා. එතනින් පාර දෙනවනම් අඩි පහළොවක් විතර ගොඩ කරගෙන මීටර් සීයක විතර දුර ප්‍රමාණයක් යන්න ඕන. ආනන්ද පද්මසිරි මහත්තයා කියනවා ඒ පාර අපට හදලා දෙන්න කියලා. ලක්ෂ 10 ක 12 ක වැඩක් ක්ෂණිකව අපට කරන්න බැහැ. ප්‍රාදේශීය ලේකම්ට කරන්නත් බැහැ. නමුත් අපිට මේකට එහෙම මුදලක් වෙන් කරන්න පුළුවන්. පෙරපාසලයි, සෞඛ්‍ය මධ්‍යස්ථානයයි කියන්නේ රජයේ ආයතන දෙකක්. කොහොමහරි මුදල් වෙන් කරන්න පුළුවන්. ක්ෂණිකව වෙන් කරන්න බැහැ. ඒකට කාලයක් යනවා. ආනන්ද පද්මසිරි මහත්තයා කියනවා දැනට මිනිස්සු පෙර පාසලටයි, සෞඛ්‍ය මධ්‍යස්ථානයටයි භාවිතා කරන පාර තියෙන තැනින් එයාට පාර දෙන්න කියලා. එතනින් දෙන්න විදියක් නැහැ. පිට්ටනිය අපට වෙන් වුණොත් පිට්ටනිය මැදින් තමයි ඒ පාර යන්නේ. එහෙම වුනොත් පිට්ටනියෙන් වැඩක් නැහැ. ඉතින් ඔහොම කතාබහ කරලා නැගිටලා ගියා. නමුත් දැන් පද්මසිරි මහත්මයා මේ නඩුව දාල තියෙන්නෙ. නඩුව යනවා. අපිට මේකට මැදිහත් වෙන්න විදිහකුත් නැහැ. මේක බේරගන්න විදිහක් නැහැ. සභාපතිතුමා හරි එයාගෙ නියෝජිතයෙක් හරි නඩුවට ගිහිල්ලා, අපට මේක අයිති නැහැ කියලා නඩුවෙන් ඉවත් වෙන්න තමයි අපට සිදුවන්නේ. ප්‍රාදේශීය ලේකම් නඩුවට යන්නෙ නැහැ. එතකොට එයාගෙ ප්‍රමාණය මැනලා වෙන් කරගන්න, ඒකපාක්ෂික තීන්දුවක් ආනන්ද පද්මසිරි මහත්මයට ලැබෙනවා. ප්‍රාදේශීය ලේකම් ස්වේච්ඡාවෙන් නඩුවට ඉදිරිපත් වෙන්නේ නැහැ. එහෙම නම් ප්‍රාදේශීය ලේකම් නඩුවට ඇතුල් කරන්න ඕන. එහෙම ක්‍රමවේද තියෙනවා. ඒක නිසා දැන් මේ ගමේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් ඉන්නවා. ඒ තුන්දෙනයි, මේකට මැදිහත් වෙන ගෝනදෙනිය ගමේ ප්‍රජාව ඉන්නවා. ඒ නිසා ආනන්ද පද්මසිරි මහත්මයා කියන්නේ දේශපාලන නායකයෙක්. එතුමා ජනතාවගේ පැත්ත ගනීවි. එහෙම උපක්‍රමයක් යොදලා හරි මේක බේරගන්න ක්‍රමවේදයක් සකස් වෙන්න ඕන. නැත්නම් එතුමගේ ක්‍රමවේදය එතුමා ක්‍රියාත්මක කරලා එතුමගේ අයිතිවාසිකම් ලබාගන්න කටයුතු කරාවි. තරංග මන්ත්‍රීතුමා සහ ධනංජය මන්ත්‍රීතුමා මෙතන හිටිය නම් හොඳයි. ඔබතුමා ඒ අයට පැහැදිලි කරලා දෙන්න. ඔන්න ඔය වගේ තත්වයක් තමයි ගෝනදෙනිය ක්‍රීඩාපිටියට තියෙන්නෙ.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමා කියා සිටියේ මෙම නඩුවට ඉදිරිපත් වුනොත්, අපට අවාසිදායක තත්වයක් පවතින බැවින්, සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීම සුදුසු බවයි. එමෙන්ම අපට මෙයින් බැහැර වීමටනොහැකි බවත්, ප්‍රකාශ කළේය.

12. නඩු අංක එල් 15888 දරණ නඩුවේ නීතිඥ ගාස්තු ලබා ගැනීම සම්බන්ධව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

අදාළ නඩුවේ නීතිඥ ගාස්තු සභාවෙන් ගෙවන්න කියලා ලක්රුවන් මන්ත්‍රීතුමා ඉල්ලීමක් කර ඇති බවත්, නමුත් ඒ සඳහා කොමසාරිස්තුමා විසින් අනුමැතිය ලබා දෙන ලද ලිපියක් තවම අප වෙත ලැබී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න**

i. මාපලගම මහජන පුස්තකාලයේ ගොඩනැගිල්ලේ වහල පිළිසකර නොකරන්නේ කුමක් නිසාද?
   මෙහිදී ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ, ධර්මසිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් වී අඹ ගසේ අතු ඉවත් කර පුස්තකාල ගොඩනැගිල්ලේ වහළ පසුගිය කාලයේ අළුත්වැඩියා කල අතර, ඒ බව රංජිත් ජයවීර මන්ත්‍රීතුමා දන්නා බවත්ය.

ii. මාපලගම බස් නැවතුම්පොලේ පොදු වැසිකිලියේ තත්වය කුමක්ද?

iii. නව වැසිකිලි පද්ධතිය හදනවද?
   ලක්ෂ 100 වැසිකිලි පද්ධතිය ඉදිකිරීම සඳහා ඉඩකඩ මදි බව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පැවසූ අතර එබැවින්, මාපලගම බස් නැවතුම්පොලේ පොදු වැසිකිලිය ක්‍රියාත්මක නොවේ. තිබෙන ඉඩකඩ අනුව පෙර ඇස්තමේන්තුවට වැසිකිලි පද්ධතිය ලබා දෙන්න කියලා ප්‍රතිපාදන වෙන් කල අමාත්‍යතුමා දැනුවත් කල යුතුයි. මෙය මෙතනට අත්‍යවශ්‍යය දෙයක්. එබැවින් මෙය අත්හැර දැමීමේ අදහසක් නොමැති බවද , ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
   මෙහිදී ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා, ගරු උපසභාපතිතුමා, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා, ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා අදහස් දැක්වූ අතර ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ප්‍රකාශ කර සිටියේ සජිත් ප්‍රේමදාස ඇමතිතුමා සැප්තැම්බර් මස 25 වන දින මූලන පංසලේ චෛත්‍යය විවෘත කිරීමට පැමිණි පසු අපි බලාපොරොත්තු වන විදියට ලිඛිතව එතුමට ඉල්ලීමක් ඉදිරිපත් කරමු යනුවෙනි.
   මෙහිදී ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා ප්‍රකාශ කර සිටියේ බසස්නැවතුම්පළට වැසිකිලි පහසුකම් ලබාදීම මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සතු වගකීමක් බැවින්, වැසිකිලි පහසුකම් ලබා දෙන ලෙස දන්වා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට ලිපියක් යොමු කිරීමට පියවර ගන්නා ලෙස දන්වන ලද අතර, අවශ්‍ය පහසුකම් ලබා නොදෙන්නේ නම්, බස්නැවතුම්පොල තහනම් කිරීමේ බලයක් ඇති බවද ප්‍රකාශ කරන ලදී.
   වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම සඳහා අවසර ලබා දෙන ලෙස මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සභාවෙන් අවසර ඉල්ලූ අතර, අප විසින් අවසරය ලබා දුන්නද, වැසිකිලි පද්ධතිය ඉදි නොකරන ලද අතර, බස්නැවතුම්පොලට වැසිකිලි පහසුකම් ලබාදීම මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ වගකීමක් බැවින් වහාම වැසැකිළි පද්ධතියක් ලබා දීමට කටයුතු කරන ලෙස සහ වැසිකිලි පද්ධතියක් සඳහා මුදල් වෙන් වී ඇති අතර, එහි ඉදිරි තත්වය කුමක්ද යන්න විමසා ලිපියක් යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

**ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

i. පොළොව කැණීම් කර වැලි එකතු කර ප්‍රවාහනය කරනු ලබන ස්ථාන වැලි ප්‍රවාහනයට හා ගල් මෝල්වලින් ගල් ප්‍රවාහනය සඳහා, සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් රු. 100000.00 ක තැන්පතු මුදලක් ලබා ගැනීම
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

ii. 2019.01.08 දින මාසික මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව විධිමත් ලෙස සභා සම්මත නොවුන නිසා විධිමත් ලෙස සභා සම්මත කර ගැනීම සඳහා නැවත ඉදිරිපත් කරමි.
විදුලි බල්පත්, ජල බිල්පත් හා දුරකථන බිල්පත් නියමිත දිනට නොගෙවීම නිසා ඒ සඳහා පොලී මුදලක්ද එකතු වන අතර, මුදල ගෙවීම හිඟ වීම නිසා විසන්ධි කිරීමට සිදු වේ. ඊට දඩ මුදලක්ද ගෙවීමට සිදු වේ. එබැවින් බිල්පත් ලද විගස මාස්පතා නියමිත දිනට මහා සභාවේ ආවරණ අනුමැතිය යටතේ ගෙවීම් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

iii. ඇල්පිටිය වැවිලි සමාගම සතු වළකුඹුර නාගොඩවත්ත ඉඩමෙහි වෙන් කරන ලද ඉඩම් කොටස ආදාහනාගාරය ඉදි කිරීම සඳහා නාගොඩ ප්‍රාදේශීය සභාවට අත්පත් කර ගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

iv. නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2020 අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය, අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

v. ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය - 2019, දේපළ සමීක්ෂණ මණ්ඩලය සඳහා පහත නම් සඳහන් ගරු සභාපති, ගරු මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් සහ නිලධාරීන්ගෙන් සමන්විත පහත සමීක්ෂණ මණ්ඩලය තෝරා පත් කර ගැනීමට යෝජනා කරමි.
   i. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා
   ii. සභා ලේකම් චන්ද්‍රිකා දයාවංශ මිය
   iii. ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය

iv. ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
v. ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා
vi. ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය
vii. සංවර්ධන නිලධාරී කේ.ජී. ජයනි මිය
viii. කළමනාකරණ සහකාර චන්දිමා සෙනවිරත්න මිය
ix. තාක්ෂණ නිලධාරී කුසල් එදිරිසිංහ මයා
x. ආදායම් පරීක්ෂක අයේෂ් ශානක මයා

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

vi. උඩුගම උප කාර්යාලය සඳහා මාසිකව එන ජල බිල්පතේ වටිනාකම ඉතා ඉහළ අගයක් ගන්නා බැවින්, මහජන පුස්තකාලයේ හා උප කාර්යාලයේ පරිහරණය සඳහා උප කාරයාල පරිශ්‍රයේ ළිඳක් කපා ජලය ලබා ගැනීමටත්, ඒ සඳහා සභා අරමුදලින් වැය දැරීමටත්, යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

vii. තල්ගස්වල බදාදා සති පොළෙහි මාළු සහ මස් වෙළදාම කරන ව්‍යාපාර කුටි සහ ලැලි 2020 වර්ෂය සඳහා පොළ බදු කරුගෙන් වෙන් කොට වෙනම ටෙන්ඩර් කිරීමට යෝජනා කරමි.

මෙහිදී ඒකාධිකාරයක් ඇතිවීම වැළැක්වීම සඳහා කඩ කාමර කිහිපයක් වෙන් කර ටෙන්ඩර් කිරීමට තීරණය විය.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

viii. උඩුගම සදුදා සති පොළෙහි මාළු සහ මස් විකිණිය හැකි ව්‍යාපාරික් ස්ථානයක් ඉදි කොට 2020 වර්ෂය සඳහා පොළ බදු කරුගෙන් වෙන් කොට වෙනම ටෙන්ඩර් කිරීමට යෝජනා කරමි.

මෙහිදී ඒකාධිකාරයක් ඇතිවීම වැළැක්වීම සඳහා කඩ කාමර කිහිපයක් වෙන් කර ටෙන්ඩර් කිරීමට තීරණය විය.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

ix. නාගොඩ පැරණි ආයුර්වේද මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල 2020 වර්ෂයේ සිට බාහිර පාර්ශව වෙත වාර්ෂිකව ටෙන්ඩර් කිරීමට යෝජනා කරමි.
පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් මත කටයුතු කිරීමට තීරණය විය.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

x. ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතාගේ ඉල්ලීම අනුව අංක එල් 15888 දරණ නඩුව සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලද පසු නීතිඥ ගාස්තු ගෙවීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

xi. ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා අසනීප තත්වයෙන් රෝහල්ගතවී ඇති බැවින් අද දින ඔහුට නිවාඩු අනුමත කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

xii. **ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 36 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

**2019.09.10 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.2019 අගෝස්තු මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 240.00 |
| 4501090200 | - මාපලගම වෙළඳ සංකීරණ කොරිඩෝව | - රු. 368.10 |
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 752.40 |
| 4509082908 | - උක්ඔවිට පෙර පාසල | - රු. 514.50 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 240.00 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 7277.80 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1777.20 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 276.60 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 1155.00 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 2106.60 |

**2019 ජූලි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 368.10 |

**2019 අප්‍රේල් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 294.90 |

**02. 2019 අගෝස්තු මස දුරකථන ගාස්තු ගෙවීම - ශ්‍රී** ලංකා ටෙලිකොම්

| | | |
|---|---|---|
| 0912296537 | - ප්‍රධාන කාර්යාලය ( සභාපතිතුමා) | - රු. 5235.51 |
| 0912296433 | **-** ප්‍රධාන කාර්යාලය | -රු. 7293.31 |
| 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 475.09 |

**03. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**

උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (2019.07.16- 2019.08.15) - රු. 984.29

**2019 ජූලි සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම - 0912231201**
2019.07.01 – 2019.07.31 දක්වා - රු. 2864.96

**04. මොබිටෙල් පුද්ගලික සමාගම**
පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2019.08.25) - රු. 68.86

**05.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**
33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2019.07.21 – 2019.08.21) -රු. 5509.27
33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2019.07.21-2019.08.21)- රු. 1422.24

**06. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. රාජකාරි අවශ්‍යතා සඳහා PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 1250.00

**07. අතිකාල දීමනා ගෙවීම**

**2019 අගෝස්තු මස**

| | | |
|---|---|---|
| ඩබ්.ඒ.සී මධුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 817.70 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 7075.50 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු.7680.00 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු.8809.20 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.8360.00 |
| එන්.එම්.රජිත මයා | -අනියම් මුරකරු | - රු.8080.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු.8360.00 |
| කේ.ජී. ලෙස්ලි සිරිවර්ධන මයා | - විදුලි කාර්මික | - රු1475.55 |
| පී.කේ. චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 486.00 |
| රංජිත් උදය කුමාර | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 849.00 |

**08 .2019 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6200.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**09. 2019 අගෝස්තු මස ගමන් වියදම්**
**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන | - ගරු සභාපති | - රු. 6000.00 |
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 2730.00 |
| පී.ඩී. යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | - රු. 530.00 |
| කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1250.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 4200.00 |
| චමරි මධුෂානි | - කාර්යාල කාර්ය සහායක | - රු. 480.00 |

<u>**පුහුණු වැඩසටහන් සඳහා**</u>

| | | |
|---|---|---|
| සී. දයාවංශ මිය | - ලේකම් | - රු. 2180.00 |
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 2790.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 1760.00 |
| කුසල් එදිරිසිංහ මයා | - තාක්ෂණ නිලධාරී | - රු. 3866.00 |
| එන්.ජී .ගීතා රංජනී මිය | - පුස්තකාල සහායක | - රු. 1740.00 |
| ලෙස්ලි සිරිවර්ධන | - විදුලි කාර්මික | - රු. 1705.00 |

<u>**10. 2019 සැප්තැම්බර් මස ගමන් වියදම්**</u>

<u>**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**</u>

| | | |
|---|---|---|
| පී.ඩී. යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | - රු. 530.00 |
| ඉරේෂා මල්කාන්ති මදනායක | - සංවර්ධන නිලධාරී | - රු. 900.00 |
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 910.00 |

<u>**පුහුණු වැඩසටහන් සඳහා**</u>

| | | |
|---|---|---|
| සී. දයාවංශ මිය | - ලේකම් | - රු. 1090.00 |

**11. එල්.ඒ ජේ. දිවාකර මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/06/28) - රු. 430.00

**12. සී.දයාවංශ මිය, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

2019 අගෝස්තු මස නිවාඩු දින හා සති අන්ත නිවාඩු දිනයන්හි සේවයේ යෙදීම වෙනුවෙන් දින වැටුප් ගෙවීම - රු. 2066.60

**13. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 10000.00

**14.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය**

<u>**2019 ජූලි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**</u>

| | |
|---|---|
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 84 ක් | - රු. 8736.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 35 ක් | - රු. 3640.00 |
| ඩෙංගු මර්ධන කටයුතු සඳහා පෙට්‍රල් ලීටර් 4 | - රු. 544.00 |
| ඩෙංගු මර්ධන කටයුතු සඳහා ඩීසල් ලීටර් 20 | - <u>රු. 2080.00</u> |
| **එකතුව** | **- <u>රු. 15000.00</u>** |

**15. ලංකා ෆිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2019 අගෝස්තු මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 597ක් | - රු. 62400.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 150 ක් | - රු. 15600.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 120 ක් | - රු. 12480.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 140 ක් | - රු. 14560.00 |
| **එකතුව** | **- රු.105040.00** |

**16.හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

i. නඩු අංක එල් 1642 ට අදාළව 2019.08.23 කැඳවන ලද නඩු වාරය සඳහා නීතිඥ පෙනී සිටීමේ ගාස්තු , 2019.08.23 කැඳවන ලද එල් 13814 නඩුව සඳහා නීතිඥ පෙනී සිටීමේ ගාස්තු හා 2019.09.03 දිනැති පී 14658 දරණ නඩුව වෙනුවෙන් නීතිඥ පෙනී සිටීමේ ගාස්තු -රු. 12640.00

**17.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 සැප්තැම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00

ii. 2019 අගෝස්තු මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2310.00

**18. ඒ.ඩී. කරුණාරත්න මයා ,සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

2019 අගෝස්තු - රු. 7050.00

**19.එම්.ඒ. සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

2019 ජූලි - රු. 2570.00

**20. එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

2019 අගෝස්තු - රු. 4820.00

**21. බුද්ධික කරුණාරත්න, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

| | |
|---|---|
| 2019 මැයි | - රු. 4830.00 |
| 2019 ජුනි | - රු. 4970.00 |
| 2019 ජූලි | - රු. 5340.00 |

**22. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

i. PF 7360 දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.13680.00

**23**. **රෙජිස්ට්‍රාර් ජෙනරාල්,ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය,බලපිටිය**

2018 පෙබරවාරි මාසයට මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනාව -රු.100.00

**24**. **රෙජිස්ටාර් ජෙනරාල්,ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය,ගාල්ල**
2015 ජූලි මස සිට 2015 දෙසැම්බර් මාසය දක්වා මුද්දර ගාස්තු උප ලේඛන
පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනාව -රු.28800.00

**25**. **රෙජිස්ටාර් ජෙනරාල්,ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය,ඇල්පිටිය**

i. 2017 මැයි මස සිට 2017 අගෝස්තු මස දක්වා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනාව -රු1500.00
ii. 2017 සැප්තැම්බර් මස සිට 2017 දෙසැම්බර් මස දක්වා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනාව -රු.600.00
iii. 2018 ජනවාරි මස සිට 2018 මාර්තු මස දක්වා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනාව -රු.500.00
iv. 2018 ජුනි මස සිට 2018 අගෝස්තු මස දක්වා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනාව -රු.700.00
v. 2018 සැප්තැම්බර් මස සහ ඔක්තෝම්බර් මස දක්වා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනාව -රු.400.00
vi. 2018 දෙසැම්බර් මාසය සඳහා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනාව -රු.300.00
vii. 2019 ජනවාරි මස සිට 2019 මාර්තු මස දක්වා මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනාව -රු.700.00

**26. ස්වර්ණා පෙරේරා , තුඩැල්ල, ජාඇළ**
නාගොඩ, මාපලගම, උඩුගම මහජන පුස්තකාල තුන සඳහා කැඩපත ග්‍රන්ථය
මිලදී ගැනීමේ වියදම් - රු. 1112.50

**27. ජේ.පී. කමියුනිකේෂන්, නාගොඩ**
2019 වර්ෂයේ සාහිත්‍ය නිර්මාණ තරඟාවලියේ චිත්‍ර තරඟ සඳහා - රු. 2850.00
ඩ්‍රෝවින් පේපර් ලබා ගැනීමේ වියදම

**28. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල
බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා සැප්තැම්බර් මස මාසික
කුලීය ගෙවීම - රු. 4000.00

**29. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2019 අගෝස්තු)- රු.13000.00

**30. දසමස් වැටුප් අත්තිකාරම් ගෙවීම්**
ඩබ්.ජී. දයානන්ද මයා - රු.230900.00

**31. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**

i. 2019 අගෝස්තු මස 13 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 2899.00

**32. ආර්. ඒ. රංජිත් මානෙල් මයා, සීගිරි හොටෙල්, නාගොඩ**

i. 2019 අගෝස්තු මස 13 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (කෑම සඳහා) - රු.5460.00

<u>පොදු අරමුදල් කර්මාන්ත</u>

**33. ඒ.කේ.ජේ. ගයාන් සංජීව, යටලමත්ත**

i. උඩලමත්ත පුහුල්හේන වෙදහේන මාර්ගය ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම - රු. 43500.00

ii. උඩලමත්ත ගල්කන්ද හේන මාර්ගය ජේ.සී.බී. යන්ත්‍ර යොදා, සිළිංඩර් දමා සංවර්ධනය කිරීම - රු. 5250.00

<u>රජයේ ආධාර</u>

**මන්ත්‍රී ප්‍රතිපාදන - සම්පත් අතුකෝරල මැතිතුමා**

**34. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**

නාගොඩ ස්වශක්ති සමිතිය සඳහා සිමෙන්ති කොට්ට 15 ක් ලබා දීම වෙනුවෙන් ගෙවීම - රු. 14400.00

**මන්ත්‍රී ප්‍රතිපාදන - සුමනසිරි ලියනගේ මැතිතුමා**

**35. කේ.කේ.බී.රාජකරුණා මයා, සී.පී.ආර් එන්ටර්ප්‍රයිසස්, යටලමත්ත**

උඩවැලිවිට්තලාව ගල්ලෙනමුල්ල අතුරු මාර්ගය ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම - රු. 20000.00

**36. ජී.ජී. ධම්මික සිරිමෙවන් මයා, ගෝණදෙනිය, උඩුගම**

මාමණදොල වතු ක්‍රීඩාංගණය මැද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම - රු. 7500.00

**ඉදිරි ගෙවීම් වාර්තාව සම්බන්ධයෙන්, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ප්‍රකාශ කර සිටියේ දැනට සභාවේ පවතින ආදායම් තත්වයත් සමඟ ඉදිරියේදී අත්‍යාවශ්‍ය රාජකාරි වලදී අතිකාල සහ ගමන් වියදම්, අනෙකුත් වියදම් සීමා කර ගනිමින් කටයුතු කල යුතු බවයි.**

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ප්‍රකාශ කර සිටියේ, සභාවේ සිටින ස්ථිර නොවූ සේවකයන් ස්ථිර කිරීමේ ක්‍රමවේදයක් සිදු කර ඔවුන්ට සභා අරමුදල් මගින් වැටුප් නොගෙවා වෙනත් ක්‍රමවේදයකින් වැටුප් ගෙවීමට කටයුතු කිරීම සුදුසු බවයි.**

**අංක 01 සිට 36 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

<u>**2019.09.10 දින පවත්වනු ලබන මහා සභා රැස්වීම සඳහා ඉදිරිපත් කල යුතු ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ වාර්තාව**</u>

**<u>01.මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම</u>**

**<u>2019 මාර්තු මස විදුලි බිල්පත්</u>**

2810236100 - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගණය - රු. 2673.90

**<u>2019 ජුනි මස විදුලි බිල්පත්</u>**

8616374000 - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් - රු. 240.00
4599064300 - ගෝණදෙනිය පෙර පාසල - රු. 294.90

**<u>2019 ජූලි මස විදුලි බිල්පත්</u>**

4507357802 - සමනළ පෙර පාසල - රු. 349.80
4591713210 - ප්‍රධාන කාර්යාලය - රු. 7666.25
8617046104 - උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානය - රු. 606.00
4594192319 - උඩුගම උප කාර්යාලය - රු. 1612.50
4593739918 - මාපලගම උප කාර්යාලය - රු. 789.00
4501090200 - මාපලගම වෙලඳ සංකීර්ණ කොරිඩෝව - රු. 331.50
2813189405 - තල්ගස්වල පෙර පාසල - රු. 331.50
4509082908 - උක්ඕවිට පෙර පාසල - රු. 313.20
2810236100 - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගණය - රු. 240.00
2809093105 - කොම්පෝස්ට් ව්‍යාපෘතිය - රු.1704.00
4599064300 - ගෝණදෙනිය පෙර පාසල - රු. 240.00
8616374000 - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් - රු. 240.00
8616373802 - උඩුගම පොළ - රු. 240.00

**02.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය ජල බිල්පත
(2019.06.20 – 2019.07.21) -රු. 326.80

**03. 2019 ජුනි මස දුරකථන ගාස්තු ගෙවීම - ශ්‍රී ලංකා ටෙලිකොම්**

0912231201 - සභාපතිතුමාගේ නිවස - රු. 2671.37

**04. 2019 ජුනි මස දුරකථන ගාස්තු ගෙවීම - ශ්‍රී ලංකා ටෙලිකොම්**

0912296537 - ප්‍රධාන කාර්යාලය ( සභාපතිතුමා) - රු. 4898.29
0912296433 - ප්‍රධාන කාර්යාලය -රු. 8815.76
0912296577 - මාපලගම උප කාර්යාලය - රු. 475.09

**05. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2019.06.25) - රු. 68.86

**06. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

සුළු අක්මුදල් ප්‍රතිපූර්ණය - රු. 2922.00

**07. පෝස්ට් මාස්ටර් ජනරාල් ගි.අ.013100199027346 ට බැර**
2019 අගෝස්තු මස තැපැල් ගාස්තු ගෙවීම - රු. 7000.00

**08. කේ.ඒ.නලින් වසන්ත මයා**
වාහන වෙන්දේසිය වෙනුවෙන් අය කර ගන්නා ලද තැන්පතු ගාස්තුව ආපසු ගෙවීම- රු. 3000.00

**09. එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන් මයා,**
2019 ජුලි මස පුවත්පත් සැපයීම වෙනුවෙන් ගාස්තු ගෙවීම - රු. 5100.00

**10. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ගි.අ.086100140021149 ට බැර**

ආදාහනාගාරය සඳහා වෙන් කර ඇති භූමියෙහි ජාතික පර්යෝෂණ සංවිධානය
මගින් භූමි යෝග්‍යතා සහතිකයක් ලබා ගැනීම සඳහා ගාස්තුව - රු. 3600.00

**අංක 01 සිට 10 දක්වා ඇති ආවරණ අනුමැතිය යටතේ ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- ❖ **ප.ව. 12.45 ට ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා සහ ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා සභාවෙන් අවසර රැගෙන බැහැරව යන ලදී.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**(ඉ) 2.1. ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. කුඹුරුහේන දොලේකඩේ ළඟ සිට චන්ද්‍රදාස මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් දමා පිළිසකර කිරීම
ii. ගමගොඩ පාර කෙලවර ගිංගහ වත්ත පාර කොරිපස් දමා සකස් කිරීම
iii. කුඹුරුහේන නො.20 කොටසේ ප්‍රජා ශාලාවක් නොමැති බැවින් ඒ සඳහා ඉඩම් කැබැල්ලක්ද ඇති බැවින් ප්‍රජා ශාලාවක් ඉදි කිරීම සඳහා අවසර ලබා ගැනීම.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රි අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 2.2. ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. උඩවැලිවිටිතලාව අන්නාසිගලදෙනිය මාර්ගයේ ඉතිරි කොටස ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සකස් කිරීම
ii. ලෝක ළමා දිනය වෙනුවෙන් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ළමුන් වෙනුවෙන් ප්‍රාථමික, ද්විතික, ජොෂ්ඨ ලෙස චිත්‍ර තරඟයක් පැවැත්වීම

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

iii. නාගොඩ විජිතාරාම විහාරස්ථානයේ පවතින පිංකම් මාලාවේ 2019.සැප්. 11 වන දින පැවැත්වෙන බෝධි පූජා පිංකම සඳහා නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් දායකත්වය දරණ අතර, ඒ සඳහා රු. 25000.00 ක මුදලක් සභා අරමුදලින් වැය දැරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

| | | |
|---|---|---|
| i. | තලංගහවත්තේ බොතේජු ඉහළ කොටසේ පරෙට්ටු මඩුව අසළ සිට ශ්‍රී මුත්තුමාරි දේවාලයට යන පාර කොන්ක්‍රීට් කිරීම | රු. 600000.00 |
| ii. | උඩලමත්ත අලුත්නුවර සිට උතුරු කුරුපනාව දෙසට ගමන් ගන්නා මාර්ගය මීටර් 600 ක් කොන්ක්‍රීට් කිරීම | රු. 4700000.00 |
| iii. | ගෝණදෙනිය මාවත දෙවන අතුරු මාර්ගය අනුර ජාගොඩ මහතාගේ නිවස අසළ සිට ඉදිරියට ප්‍රතිසංස්කරණය කිරීම | රු. 600000.00 |
| iv. | ගෝණදෙනිය අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | රු. 3200000.00 |
| v. | උඩුගම හෝමදොලවත්ත ස්ටොක්ලන්ඩ් කොටසේ උඩුගම පාසල අසළ සිට ස්ටොක්ලන්ඩ් වතුයායේ පල්ලියට සහ කෝවිලට යන පාර කොන්ක්‍රීට් කිරීම | රු. 600000.00 |
| vi. | තල්ගස්වල නව නගර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | රු. 600000.00 |
| vii. | එම්.එච්.එම්.ප්‍රේමදාස මහතාගේ නිවස අසළ සිට ඉදිරියට ඇති නාගොඩ ඉහළ අන්නාසිගලහේන අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | රු. 600000.00 |
| viii. | උක්ඕවිට සිට බටහේන්ගොඩ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | රු. 600000.00 |
| ix. | නාගොඩ උඩුගම ගෝණදෙනියට අයත් හිරිඹුරවත්ත පාසල්ගොඩකන්ද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | රු. 500000.00 |
| x. | නාගොඩ වළකුඹුර 70 කන්ද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | රු. 600000.00 |
| xi. | ගෝණදෙනිය දිසානායක මාවතේ තුංමංහන්දියේ සිට ටී.ජී. බුද්ධික මහතාගේ නිවාසය දක්වා ප්‍රතිසංස්කරණය කිරීම | රු. 500000.00 |
| xii. | නාගොඩ උඩුගම ගෝණදෙනියට අයත් යහලඳුවවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | රු. 500000.00 |
| xiii. | නාගොඩවත්ත දෙවන අදියර අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | රු. 30000.00 |
| xiv. | ගම්මැද්දේගොඩ උතුර කුරුඳු කැටිය මාර්ගය සංවර්ධනය කිරීම | රු. 20000.00 |
| xv. | හෝමදොළ නෙලුවැල් මූකලාන මාර්ගය සංවර්ධනය කිරීම | රු. 12500.00 |

**ඉහත සඳහන් මාර්ග සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**නැත.**

**(ඊ) කාරක සභා වාර්තා**

නැත

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- ❖ 2019 අගෝස්තු මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සළකා බැලීම සඳහා සැප්තැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2019 අගෝස්තු මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා සැප්තැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2019 අගෝස්තු මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා සැප්තැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) .වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රිනී කේ. කේ. අයි. නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමනි, මට මේ වෙලාවේ දැනගන්න ඕන. උඩවැලිවිටිය පෙලෙන්ගහදූව වත්තේ තියෙන ප්‍රජා ශාලාවේ අයිතිය තියෙන්නේ කාටද කියන එක ගැන. මොකද මේ වන විට රුපියල් 7487 ක විදුලි බිලක් ඇවිල්ලා තියෙනවා. දැනට විදුලිය විසන්ධි කරල තියෙන්නෙ. විදුලි බිල ඇවිල්ල තියෙන්නෙ ගොවි සංවිධානයේ නමට. සමෘද්ධි සමිතියෙන් තමයි මේ විදුලි බිල මට පෙන්නුවේ. ඒ නිසා තීරණයක් අරගෙන, සභාවෙන් ගෙවලා හරි, ඒ සම්බන්ධව මොනවා හරි පිළියමක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,**

එම ප්‍රජාශාලාව නාගොඩ ප්‍රාදේශීය සභාවට ලබා දීලා තියෙන්නෙ. මේ විදුලි බිල ගෙවන්න කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලියුමක් එවලා තිබුනා. නමුත් එකේ නීත්‍යානුකූලභාවය අපට නැහැ. එය අපට ලොකු සම්පතක්. ඒ නිසා නෙරංජලී මන්ත්‍රීතුමිය හා ලක්රුවන් මන්ත්‍රීතුමා කතා කරලා, දැනට මේ බිල ගෙවලා, ප්‍රාදේශීය සභාවෙ නමට විදුලි බිල නීත්‍යානුකූලව ලබා ගැනීමට කටයුතු කරන්න.

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මම ප්‍රථමයෙන්ම ගරු සභාපතිතුමනි, 19 වන වතාවටත් දූරියන් ගහ කපලා දෙන්න කියලා ආච්චි කෙනෙක් ඉල්ලීමක් කළා. තවම ඒ දූරියන් ගහ කපලා නැහැ. මේ සම්බන්ධව ඔබ තුමා අරගෙන තියෙන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම දැනගන්න කැමතියි. මොකද මටත් මේ නිසා ගෙදර ඉන්න විදියක් නැහැ. අද උදෙත් මාව හමුවෙන්න ඒ ආච්චි අපේ ගෙදරට ආවා. ඒ නිසා ඒ ගහ ඉවත් කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමා, හෝමදොල හන්දිය හා ඒ අවට ප්‍රදේශය පුරාම කුණු එකතු කරලා නැහැ. පහුගිය දවස්වල කුණු බකට්වල පනුවෝ පවා දාපු අවස්ථා තියෙනවා. මමත් ගිහිල්ලා සොයා බැලුවා. ගරු සභාපතිතුමනි, පොලේ ප්‍රශ්නය වෙරංග මන්ත්‍රීතුමා කතා කරාවි. පහුගිය කාලේ ඔබතුමා පොළේ කඩ කාමර හදන්න ලී ගිනිහිල්ලා, යම්කිසි දෙයක් කරන්න හැදුවා. අද වන විටත් කම්කරුවෝ එතන

වැඩ. නමුත් කිසිම ක්‍රමවේදයකට වැඩපිළිවෙළක් යන්නේ නැහැ. ලී වලින් හදපු කඩ කාමර මොකුත් නැහැ. ලී කැල්ලක්වත් නැහැ. මම හිතන්නේ ඒවා දර වලට අරගෙන. ලක්ෂ ගානක මුදලක් අපතේ යන්න වැඩ කටයුතු කළා. යම් ක්‍රමවේදයකට හැදුවනම්, අද කඩ කාමර දහයක්, පහළොවක් හරි අපට හදාගන්න තිබුණා. ඒ නිසා ඒකටත් යම්කිසි ක්‍රමවේදයක් හදන්න කියලා ගෞරවනීය ඉල්ලීමක් කරනවා. පහුගිය දවස් වල වර්ෂාවත් එක්ක පොළට යන්න බැරි තත්ත්වයකට පත්වෙලා තිබුණා. අද කම්කරුවො ටිකක් ගිහිල්ලා බැදි ටිකක් සුද්ද කරනවා. ඒකත් හෙට වෙනකොට නවතීවි. ආයෙත් කැලේට යාවි. ඒ නිසා මොකක් හරි හොඳ ක්‍රමවේදයට කටයුතු කරන්න කියලා කරුණාවෙන් ඉල්ලනවා. මොකද උඩුගම මන්ත්‍රීවරු විදිහට වෙරංග මන්ත්‍රීතුමා පොළ හදන්න සැහෙන උත්සාහයක් ගත්තා. නමුත් ඒ සල්ලි වලින් කිසිම ප්‍රයෝජනයක් සිදු වුණේ නැහැ. සභාවට හොඳ නාමයක් එන තත්ත්වයක් ඇත්තෙත් නැහැ. ලී ටිකත් මිනිස්සු දර බවට පත්කරලා ඉවරයි. එනිසා යම් මට්ටමකට වැඩපිළිවෙළක් හදන්න කියලා ඉල්ලීම කරමින්, මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ප්‍රධාන මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගොඩක් කාලෙකින් කතා කරන්න බැරි වුණා. දැන් සභා අරමුදලෙත් සල්ලි ඉවරවෙච්ච කාලෙක, අපි පොඩ්ඩක් අතීතයට යන්න ඕන කියලා මට මතක් වුණා. හැමදාමත් මම මුලින්ම මේ සභාවට ඇවිල්ලා මගේ ගමේ, කොට්ඨාශයේ තියෙන අත්‍යවශ්‍ය කරුණු කාරණා පිළිබඳව, ඉතා ධනාත්මක ස්වරූපයෙන් මම ඒ හැම දෙයක් පිළිබඳව ම කරුණු කාරණා, ලිඛිතව සහ වාචිකව මේ සභාව ඉදිරියේ වාර්තා කරලා තියෙනවා. ඒ අතරට අපේ ගමේ ප්‍රධානතම ගැටලුව වෙලා තියෙන්නේ, උඩුගම පොළ සම්බන්ධ ගැටලුව. මේ සම්බන්ධව අපි හැමදාම කතා කළා. අපේ තරංග මන්ත්‍රීතුමා ඇතුළු අපේ මන්ත්‍රීවරුන් සියලු දෙනාම, බෝදරගම මන්ත්‍රීතුමිය, ගයන්ති කුමාරි මන්ත්‍රීතුමිය ඇත්තටම අපි ඔක්කොම මේ ගැන කතා කළා. සභාවක් වශයෙන් අපි මේ ඉන්න තැන ගැන බොහොම කණගාටුයි. මොකද මොන ආණ්ඩුවෙන් කලත්, කෝටි ගානක් වියදම් කරලා, බිල්ඩින් එකක් හදලා, සියලු සම්පත් තිබුණත්, අපිට තවම ඒක ජනගත කරන්න, සමාජගත කරන්න, සමාජයට දායාද කරන්න බැරි වුණ එක ගැන කනගාටුවක් සහ එය අපේ දුර්වලකමක් හැටියට මම දකිනවා. මොකද සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවම දන්නවා. මම මේ සම්බන්ධව මොන තරම් කැපවීමක් කළා ද කියලා. ඒ නිසා ඇත්තටම අපට ඒ ගැන කණගාටුයි. ගරු සභාපතිතුමා, දැන් මේ ලක්ෂ හැත්තෑ ගණනක් මෙතනට ඇවිල්ලා, ඉවරවෙලා බින්දුවට වැටිච්ච වෙලාවක, ඔයිට කලින් අපිට මේක ඉටු කරන්න තිබුණා. මෙය අපේ හැමෝගෙම තියෙන සිහිනයක්. ජනතාවගේ සිතුම් පැතුම් ඉෂ්ඨ කරන්න තිබුනා. අද වන විට සම්පූර්ණ පොළ භූමිය අභිකුණ්ඨිකයන්ගෙන් පිරිලා. අභිකුන්ඨකයෝ හැමතැනම ජරා කරනවා. මලපහවල වහන මැස්සන් පොළේ තියෙන බඩු වලටත් වහනවා. ඉතින් අපේ මිනිස්සු කන එළවළු ටිකේත් මේ ජරාව. මිනිස්සුන්ට සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරන්න අවස්ථාවක් ලබා දීම අපේ ප්‍රාදේශීය සභාව සතු වගකීමක් හා යුතුකමක් නොවන්නේද? මම ඊයෙ පෙරේදත් එතනට ගිහිල්ලා ඒ අභිකුණ්ඨිකයින් ටික එළවලා දැම්මා. මම චන්දිම වීරක්කොඩි මැතිතුමාගෙන් විමධ්‍යගත අරමුදලින් රුපියල් ලක්ෂයකුත් ගෙනැල්ලා දුන්නා. අපිට තියෙන විදියට. ඒත් ඒකෙනුත් මේ සම්බන්ධව කටයුතු කළාද කියලා මම දන්නෙ නැහැ. මම ඒ ගැන හොයා බැලුවාම ප්‍රාදේශීය සභාවෙන් තවම ලියුමක් එවලා නැහැ කිව්වා.

ඒ වගේම සභාපතිතුමනි උඩුගම 218 ඩී මගේ කොට්ඨාශයේ කුරුන්ද ප්‍රදේශයේ සුසාන භූමියක් තියෙනවා. ඒ සුසාන භූමිය අවට ඉඩකඩම් තියෙනවා. අද වන විට ප්‍රජා ශාලා භූමියට පමණක් සීමා වෙලා, අනිත් සියලුම භූමිය වටේ ඉඩම් කරුවන් විසින් අත්පත් කරගෙන තියෙනවා. ඉතින් මෙය ප්‍රාදේශීය සභාව සතු අක්කර ගානක සුසාන භූමියක්. අපේ සභාවේ යුතුකම හා වගකීම වන්නේ උපතේ සිට මරණය දක්වා පහසුකම් සැපයීම නම්, ඒ යුතුකම අපට කරන්න බැරිවෙලා තියෙනවා. මම යෝජනාවක් වශයෙනුත් පෙරදී ඉදිරිපත් කළා. මේ සුසාන භූමිය අපේ පිඹුරේ සඳහන් ආකාරයට, මම

දන්නෙ නැහැ. අපිට පිඹුරක් තියෙනවද? නැද්ද? කියලා. නමුත් ප්‍රාදේශීය සභාව සතුයි කියලා කියනවා. ඒ නීත්‍යානුකූලව පැවරීම් කටයුතු කරමින්, ඒ නීත්‍යානුකූලභාවය සහතික කරමින්, ඒ සුසාන භූමිය වෙන් කරලා දෙන්න කියලා තමයි මම ඉල්ලා සිටින්නේ. මොකද තව මාසයක්, දෙකක් යනකොට, මෙම සුසාන භූමිය මහපාරට යන තත්ත්වයට පත්වෙනවා. කුරුන්ද ප්‍රදේශය කියන්නේ පර්චස් 10 ඉඩම් හිමිකරුවන් ඉන්න ප්‍රදේශයක්. ඉතින් ඒ පර්චස් 10 තුළ මිනීයක් වල දාන්න ඉඩ ප්‍රමාණයක් නැහැ. ඒ නිසා ඒ ප්‍රශ්නය නිරවුල් කරලා, මරණයක් මිහිදන් කිරීමට තියෙන ඉඩකඩ පහසුකම ලබාදෙන්න කියන ඉල්ලීම මේ අවස්ථාවේදී කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, උඩුගම උප කාර්යාලය මුල් කාලයේදී එක්, එක් යෝජනා කරමින්, බදු දෙන්න පවා යෝජනා කළා. ඊට පස්සේ ටොයිලට් කම්ප්ලෙක්ස් එකක් හදලා දැන් භාවිතා නොකරමින් පවතිනවා. පල්ලෙහා අපේ පෙර පාසලක් තියෙනවා. ඊයෙ පෙරෙද වැස්සට ඒ පෙර පාසල් භූමියේ තියෙන ටොයිලට් එක උතුරලා ළමයින්ට එළියටවත් බහින්න බැරි තත්වයක් ඇතිවෙලා තියෙනවා. ගිය අවුරුද්දෙ මට මතකයි. තරංග මන්ත්‍රීතුමාගේ දරුවා අධ්‍යාපනය ලබන අවස්ථාවේ එතුමා මැදිහත් වෙලා, යම්කිසි මට්ටමකට වැඩකොටසක් කළා. මේ කරුණු කාරණා සියලු දේට ඔබතුමා පූර්ණ මැදිහත්වීමක් කළාට, මැදිහත්වීම මොනතරම් දුරට සාර්ථකත්වයට යනවද කියලා අපට හිතෙනවා. මොකද ගිය අවුරුද්දෙත් රුපියල් හැත්තෑපත් දහසක් වියදම් කරලා පෙර පාසල් භූමියේ තියෙන වැසිකිළි පද්ධතිය හැදුවා. නමුත් හරියට හැදුවනම්, පහුගිය වර්ෂාව කාලේ ඒ ළමයින්ට අපහසුතාවයක් නොවෙන්න තිබුනා. ඉතින් අපේ පෙර පාසල් භූමිය අර ටොයිලට් කම්ප්ලෙක්ස් එක තියෙන ස්ථානයට අරගෙන ගිහිල්ලා, ඒ ළමයින්ට අවශ්‍ය කරන සනීපාරක්ෂක පහසුකම් සම්පාදනය කරන්න වැඩපිළිවෙළක් හදන්න කියලා මම යෝජනා කරනවා. මම පහුගිය කාලේ පුරාම මම දැක්කා. අපේ කම්කරුවෝ සියලුදෙනාම උපකාර්යාලය වටේ සුද්ධ කරනවා. සභාපතිතුමත් පිටිපස්සෙන් ගිහිල්ලා බලාගෙන හිටියා. කට්ටියම ඇතුලට වෙලා කයිවාරු ගහනවා. සතියක් මුළුල්ලේ උපකාර්යාලය වටේ සුද්ද කරනවා කියලා මොනවද කරල තියෙන්නේ? ඔබතුමා ටිකක් මේ ගැන කල්පනා කරලා බලන්න. සතියක් තිස්සේ හය දෙනෙක් එකතැන රැදිලා ඉන්නවා. ඒකෙ ප්‍රතිලාභය මොකක්ද? අද මේ ගම් පළාත් හැම තැනම පාරවල්වල යන්න බැහැ. කැලේ දෙපැත්තෙම කැලේ වැවිලා. ඉතින් ඒ සම්බන්ධව කටයුතු කරනවා විනා, එලක් නැතිව උප කාර්යාලයේ සතියක් තියාගෙන වැඩ කරනවා. මේකද ඵලදායිතාවය? මේකද කාර්යක්ෂමතාවය? ඒ නිසා ඔබතුමා මේ පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කරන්න ඕන. මොකද ඉන්නේ හයදෙනා නම්, ඒ හයදෙනාගෙන් උපරිම සේවයක් ලබා ගෙන ජනතාවට සේවයක් කිරීම තමයි වැදගත් වෙන්නේ. ඉතින් ඒ ගැනත් කල්පනා කරලා බලන්න. සේවකයන්ට ඕන විදිහට වැඩ කරන්න නම්, සභාපතිවරයෙක් අවශ්‍ය වෙන්නේ නැහැනේ. නායකයෙක් අවශ්‍ය වෙන්නේ නැහැ. නායකයාගේ භූමිකාව තුළ සේවකයාගේ හැසිරීම මොනතරම් දුරට අධීක්ෂණය කරනවා ද, කියන එක නායකයා සතු යුතුකමක් හා වගකීමක් වෙනවා. අපි මේ ඔබතුමාට උපදෙස් දෙනවා නෙවෙයි. නමුත් අපි කියන්නේ, අපේ ප්‍රදේශයේ, කොට්ඨාශයේ තියෙන අඩුපාඩුකම් සහ ඉදිරියේදී වෙනස් වෙන්න ඕන කරුණු කාරණා පිළිබඳව. ඒ වගේම ගයන්ති කුමාරි මන්ත්‍රීතුමිය 218 සී කොටසට ලොකු සංවර්ධන කටයුත්තක් ගෙනැල්ලා තියෙනවා. මම ඒ ගැන ඇත්තටම සතුටු වෙනවා. මොකද ගමන් කරන්න බැරි පාරක් තිබුනෙ. පාරට තාර දාලා බොහොම හොඳට හදලා තිබුනා. නමුත් මම ගයන්ති මන්ත්‍රීතුමියගෙන් අහනවා. ඔබතුමිය 218 සී කොටසට විතරද මේ සංවර්ධනය කරන්නේ. සංවර්ධනය කරන්න කොටස් 218 ඩී කොටසෙ තියෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙ අනිත් මන්ත්‍රීවරු විහිදීයන සංවර්ධන ව්‍යාපෘති රැසක් කරලා තියෙනවා මම දැක්කා. ඔබතුමිය කුඩම්මගෙ සැළකිලි දක්වන්නේ කුමන හේතුවක් මතද කියන එක ගැන පොඩි ගැටලුවක් තියෙනවා. ඒ නිසා ඒ සංවර්ධන කටයුතු වලදී, කොට්ඨාශය තුල සමානාත්මතාවයට සංවර්ධන කටයුතු කරන්න කියලා ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා. මොකද කොට්ඨාසය බාරව සංවර්ධන කටයුතු කරන්නේ ඔබතුමිය නිසා. ඒ වගේම මේ කරුණු කාරණා පිළිබඳව සභාපතිතුමා

වැඩි අවධානයක් යොමු කරන්න. අද වන විට, බහුකාර්යය ගොඩනැගිල්ලේ වතුර නැතුව මාස දෙකක් විතර තිස්සේ මොන තරම් අපහසුතාවයට මිනිස්සු පත් වෙලා තියෙනවද? රැකියාවට එන මිනිස්සු, වටේ ගෙවල්වල මිනිස්සු, සැහෙන පීඩනයකට ලක්වෙලා. ඉතින් ඔබතුමා මේ අවස්ථාවෙදි පොරොන්දු වුණා. ඉතාම ඉක්මනින් හා වගකීමෙන් කටයුතු කරනවා කියලා. බහු කාර්ය ගොඩනැගිල්ලේ ජල ප්‍රශ්නය විසඳීමට මගේ සහයෝගයත් ඔබතුමාට ලබා දෙනවා. ඉතාම ඉක්මනින් එය ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටිමින්, මම මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා, නියෝජ්‍ය සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. අසනීප තත්ත්වයෙන් හිටපු නිසා ගිය සභාවාරයටත් මට සහභාගි වෙන්න බැරි වුණා. ඒ නිසා අද දිනයේ වචනයක් කථා කිරීම යුතුකමක් වෙනවා. මම අද සභාවාරයට ටිකක් පරක්කු වෙලා සහභාගි වුණේ. මට හිතුනා අද මම වැරදි පැත්තෙද වාඩි වුනේ කියලා. මොකද අපි කරන්න ඕන කතා ටික ඔක්කොම කරන්නේ ඔබතුමාගේ පාලක පක්ෂයෙන්. අද මේ වෙනත් කතා දිහා බලපුවම අපි කාලයක් තිස්සේ කතා කරපුවා එකතු කරලා, ඒ කතා ටික ම ඔබතුමාගේ පාර්ශවයෙන්ම කියනවා. උඩුගම පොළ ගැන, අනතුරුදායක ගස ගැන, ඒ වෙච්ච සිදුවීම් සියල්ල ඔබතුමාගේ පාර්ශ්වයෙන්ම ඔබතුමාට චෝදනා කරනවා. නමුත් මම ඔබතුමාට චෝදනා කරන්නේ නැහැ. නමුත් අපි ඔබතුමාගේ කටයුතු ගැන අවුරුද්දක් දෙකක් කතා කරපුවා, ඉටු නොවෙච්ච එක ගැන අපට මතක් වෙනවා. අපේ ගරු සමන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ, අර අනතුරුදායක ගස ගැන මුලින්ම සභාවට කරුණු ඉදිරිපත් කළේ මම. අද වෙන විට ඒකෙ අයිතිය ගැන හොයාගෙන යනවා. අනතුරුදායක ගසක් ඉවත් කරන්න අයිතිය හොයන්න වුවමනාවක් නැහැ. ප්‍රාදේශීය සභාව තමයි ඒකේ අයිතිකාරයා වෙන්නේ. මොකද ඒ වගකීම තියෙන්නේ අපට. අනතුර ඉවත් කරන්න LRC එකේද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේද, වෙනත් ආයතනයකද කියලා, අවශ්‍ය වෙන්නේ නැහැ. ඔබතුමා ලී මෝල්වලට ගිහිල්ලා කිව්වම, ඒ අය ගිහින් බැලුවා. ඒ අයට ප්‍රවාහනය කරන්න බැහැ. පර්මිට් හදන්න බැහැ. අන්න එහෙම කතාවක් තමයි සිද්ධවෙන්නේ. නමුත් අපි කතා කරන්නේ මේ ගහෙන් සිදුවන අනතුර ඉවත් කරන එක පිළිබඳව. ඒකට ප්‍රවාහන බලපත්‍රයක් ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මම හිතන්නේ උප සභාපතිතුමා මම කියන කාරණය තේරුම් අරගෙන ඇති. ඒ නිසා අනතුරුදායක ගස් ඉවත් කිරීමේ කාරණයේදී ඒක කරලා දෙන්න. මොකද, නැත්නම් ඒ මිනිස්සුන්ට සභාවෙන් ඒ ගැන ඉල්ලීමක් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. එහෙම නම් ඒ අය LRC එකෙන්ම මේක ඉවත් කරන්න කියලා ඉල්ලා සිටිවි. ඒ නිසා ගරු සභාපතිතුමා මම කියන එක ඔබතුමා පොඩ්ඩක් තේරුම් ගන්න. ඒ අය මේකෙ අයිතිකාරයගේන් අහනවනම් කෙලින්ම, LRC එකට ගිහිල්ලා කියාවි ඔයාගේ ඉඩමේ ගහක් තියෙනවා. මට අනතුරුදායකයි කියලා. නමුත් ඒ අය එන්නේ ප්‍රාදේශීය සභාවට. මොකද මේකෙ වගකිවයුත්තා වන්නේ ප්‍රාදේශීය සභාව නිසා. අනතුරුදායක ගස් ඉවත් කිරීමේ බලය තියෙන්නේ ප්‍රාදේශීය සභාවට නිසා. අපි ඒකෙ වෙළඳ වටිනාකමක් බලනවා. මේ ගහ විකුණලා ලක්ෂයකට විතර අලවියක් කරලා, කොහොමද ලාභ ගන්නෙ කියන තැනට දැන් ඇවිල්ලා තියෙන්නේ. ප්‍රශ්නය ඇතිවුණේ ඔබතුමාගේ කාලෙත් නෙවෙයි. ඉස්සර සභා කාලෙත් නෙවෙයි. දවසෙන් දෙකෙන් ගහක් ලොකු වෙන්නේ නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, වර්තමානයේ තමයි ඔය ප්‍රශ්නයට විසඳුමක් ඉල්ලන්නේ. සභාවක් විදියට මමත් දැන් අවුරුද්දයි මාස ගානක් ඒ ගැන කතා කළා. පත්තරවලත් පළ වුණා. අපේ බලය පාවිච්චි කරලා, ඒ කටයුත්ත කලානම්, ඒකට යන වියදම සභාවෙන් දාලා හරි අනතුරක් සිදුවන එක වළක්වන එක තමයි අපේ වගකීම වෙන්නේ. ඉතින් එදා අපි කතා කරපුවා අරගෙන ඔබතුමාගේ කණ්ඩායම විසින්ම ඔබතුමාට චෝදනා එල්ල කරනවා.

ඒ වගේම අපේ වෙරංග මන්ත්‍රීතුමා කතා කරපු, උඩුගම පොළ සහ ඒ පොළ ගැන සහ බිල්ඩින් හදලා පැත්තක තියෙනවා. සංවර්ධනය කරලා ඒවා වෙළෙන්දන්ට භාර දෙන්නේ නැහැ. ඊට පස්සේ බට

දාන්න ලක්ෂ ගණන් වියදම් කරනවා. ඕවා ගැන අපි කතා කළා. පොළට අඩිය තියන්න බැහැ. ෂොපිං බෑග් දාගෙන තමයි පොලට ගියෙ කියලා මම කළින් සභා වාරයක කතා කළා. නමුත් දැන් ඔබතුමාගේ කණ්ඩායම විසින්ම ඔබතුමාට විරුද්ධව කතා කරනකොට, අපට පොඩි කණගාටුවකුත් ඇති වෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා වීථි පහන් සවි කරපු එක ගැන නම්, අපි අංක එකට ස්තුතිවන්ත වෙනවා. මොකද ඉතිහාසෙ කවදාවත් සිදු නොවුනු ආකාරයකට, හැම ගමකම, හැම අස්සක, මුල්ලකම, ඒ කටයුත්ත 95%ක්ම සාර්ථකව ඉටුකරලා තියෙනවා. ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා සභාවෙ සභාපතිතුමා ලෙස යම් උත්සාහයක් ගන්න බව අපට පේනවා. නමුත් එතනින් ඒක අතහැරෙනවා. නිලධාරින් හරි, කොට්ඨාශවල මන්ත්‍රීවරු හරි, කවුරුහරි සහයෝගය දෙන්නේ නැතුව ඇති. එකේ අවසානයේ ඔබතුමාගේ පිටින් දාලා ඉවර වෙනවා. ඔබතුමා වගකීම් මේ නිලධාරීන්ට හරි මන්ත්‍රීවරුන්ට හරි බාරදීලා තියෙනවා නම්, ඔබතුමාට අහන්න පුළුවන්, කෝ මම අර එදා භාර දීපු වැඩේ කෙරුණද කියලා. අද වෙනකොට ඔබතුමා ආණ්ඩුවයි, කැබිනට් එකයි, ඇමතිකම් ටිකයි, මන්ත්‍රීකම් ටිකයි, තනියෙන් කරනවා වගේ කටයුත්තක් වෙලා තියෙන්නේ. දැන් හැමකෙනාම චෝදනා කරන්නේ ඔබතුමාට. දැන් මේ නිලධාරියෙක්වත්, තාක්ෂණ නිලධාරී කෙනෙක්වත්, කවුරුවත් ඒවට වග කියන්නෙ නැහැ. කාටහරි වගකීම පවරා තිබුණනම්, මොකද මේකට තවම විසඳුමක් නැත්තෙ කියලා අහන්න තිබුණා. අද වන විට සියළුම යෝජනා, චෝදනා භාරගන්නා බවට ඔබතුමා පත් වෙලා ඉන්නවා. ඒ ගැන මම කනගාටු වෙනවා.

ඒ වගේම පොල් ඉඩම ගැන කතා කරද්දී, පොල් ඉඩමේ උවමනාව තිබුනේ, ප්‍රාදේශිය සභාව භුක්ති විඳපු පොල් ඉඩමක්, අනවසරයෙන් හරි ප්‍රාදේශීය සභාවේ අයිතිය තිබුන එකක්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වෙන්දේසි කරන කොට තමයි අපි ගත්තේ. ඉතින් ඔබතුමාලා සාර්ථක උත්සාහයක් ගත්තා. හැබැයි අපි එදා කිව්වා මේ නිලධාරීන් මේ සේවකයන් දාලා කරගෙන ගියොත් මොකද වෙන්නෙ කියලා. නමුත් ඔබතුමා කිව්වා. මම කරල පෙන්නන්නම් කියලා. ඒ කිව්ව වගේම, ඔබතුමා ඊලග මාසේ හොඳ ප්‍රතිඵල ගෙනාවා. සභාවට ආදායමකුත් ගෙනාවා. නමුත් අපි එදා හිතපු දේ සිද්ධ වුණා. ඉතින් ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලා එදා බලාපොරොත්තු වුනේ මේක නෙවෙයි. ඔබතුමාලා බලාපොරොත්තු වුනේ, අපේ සභාවේ මෙහි අයිතිය තියාගන්න ඕන හින්දා තමයි, අපි මේක ටෙන්ඩර් එකෙන් ගන්නෙ කියලා, ඉදිරි මාස කීපය තුළ මේකෙ අයිතිය අපට හදාගන්න කටයුතු කරනවයි කියලා තමයි කිව්වේ. නමුත් ඒ මොකුත්ම සිදු වුනේ නැහැ. මේ සැරෙත් අපි මුදලාලි කෙනෙක් වගේ ඊළඟ ටෙන්ඩර් එකටත් ඉදිරිපත් වෙන්න සූදානම් වෙලා ඉන්නවා. ඒකයි මේ සභාවේ කතා කරන්න සිද්ධ වුණේ. ඒක නිසා අපි ඉදිරියේදී මේ සභාවට ගන්න පුළුවන් දේවල්, ටෙන්ඩර් වලින් තොරව නීත්‍යානුකූල අයිතිය සභාවට හදාගන්න කියල ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම ගිය සභාවට ආවේ නැහැ. අපේ කොට්ඨාස මන්ත්‍රීතුමා සමෘද්ධිය ගැන කතා කරලා තිබුණා. මම වාර්තාවෙ දැක්කා. ඇත්තටම විලේගේ මන්ත්‍රීතුමනි, ගෝණදෙණියේ පවුල් සීයකට විතර අලුතෙන් සමෘද්ධිය ලබා දුන්නා. ඔබතුමා කිව්වා වගේ මම සමෘද්ධි අධිකාරියට ගිහිල්ලා තමයි ලිස්ට් එක ගෙනාවේ. ඔබතුමා කියපු කතාව හරි. ඔබතුමාට කවුරුහරි නිලධාරියෙක් කියන්න ඇති. ඒ කටයුත්ත අදාළ නිලධාරී අතින් සිදුවෙලා තිබුණේ නැහැ. මුළු බද්දේගම ආසනයේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, සියල්ලන්ටම සමෘද්ධිය දුන්නෙ අගමැතිතුමා බද්දේගමට ඇවිල්ලා. ඒ දීපු එකකදීවත්, ගෝණදෙණියේ වසම් තුනේම එක්කෙනෙකුටවත් සමෘද්ධිය දීලා තිබුණෙ නැහැ. ඒ නිසා ඊළඟ සතියේ මට ගිහිල්ලා සොයා බලන්න සිද්ධ වුණා. ඒ නිලධාරීන්ගේ අඩුපාඩු හොයල බලලා, එක දවසින් ඒ සියල්ල ඉටු කරගෙන මාත් එක්ක ගිහිපු නිලධාරියෙක් අතේ තමයි එව්වෙ. ඒ ගෙනැල්ලා සති දෙකක් ඇතුලත අපි ගෝනදෙනියෙ සමෘද්ධිය නොලැබුණු පවුල් සීයකට විතර උත්සවයක් තියලා සමෘද්ධිය ලබා දුන්නා. ඇත්තටම ඒක ගැන ඔබතුමා හොයපු එක හොඳයි. වාර්තාවේ දැකපු විදියට, විලේගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු විදියට සමෘද්ධිය අපට ඕන විදිහට හැදුව නම්, අපට දෙන්න ඕන

අය බොහොමයක් ඉන්නවා. ඒ ලිස්ට් එකේ ඉඳලා දෙන්න බැරිවුණ අය ඉන්නවා. අපිත් උත්සාහ කළා. සමහර සාධාරණ ඒවා දෙන්න. ප්‍රා දේශිය ලේකම්ගෙන් අපි තවමත් ඉල්ලීම් කරනව එහෙම කරන්න කියලා. ඔබතුමාල ඒ කිව්ව වගේ කවුරු හරි අසාධාරණ විදිහට සමෘද්ධිය අරගෙන තියෙනවා නම්, පළමුවෙන්ම සමෘද්ධි නිලධාරී වගකියන්න ඕන. එහෙම දීලා තියෙනවනම්, ඔබතුමා පුද්ගලිකව මටත් කියන්න. මමත් ඒගොල්ලන්ගෙන් හරි වෙන කාගෙන් හරි වැරැද්දක් කරලා තියෙනවා නම්, ඒක නිවැරදි කරන්න උපරිම ලෙස මැදිහත් වෙනවා. උපරිම සාධාරණ විදියට තමයි එදා ඒ සමෘද්ධිය ලබා දුන්නේ. එකේ වැරද්දක් තියෙනවනම්, අපිත් අනිවාර්යෙන් වගකියනවා. මොකද ඒකට මමත් මැදිහත් වුන කෙනෙක් නිසා.

අවසාන වශයෙන්, ගරු සභාපතිතුමනි, අපි සියලු මන්ත්‍රීතුමන්ලා මේ මාසේ පහළොස් වැනිදා බද්දෙගම ආසනයෙන් ගම් පෙරලිය යටතේ කරපු සියලු වැඩසටහන් ජනතා අයිතියට පත් කරනවා. බද්දේගම ආසනයේ වැඩ දහසක් එකම දිනක විවෘත කරනවා. ඉතින් ඔබතුමන්ලාගෙත්, අපිත් කාගෙත් පොඩි පොඩි ප්‍රශ්න විසඳුනා කියලා අපි හිතනවා. බද්දේගම ආසනයේ පලවෙනි අදියර යටතේ කෙරෙන්න ඕන සංවර්ධන කටයුතු සියල්ල සිදු කළා. ඉතින් ඒ සියලු විවෘත කිරීම් පහළොස් වෙනිදා සිදු කරනවා. ඒ ගැන සිහිපත් කරමින්, අපේ සභාපතිතුමාට නිලධාරීන්ගේ හා පාලක පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දීලා, මේ සභාව සාර්ථකව කරගෙන යන්න හැකියාව, ශක්තිය, ධෛර්යය, ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී එන්.වී. පතිනායක මහතා**

ගරු සභාපතිතුමනි අවසරයි. මට කියන්න තියෙන්නේ, කාරණා දෙකයි. ඌරල ප්‍රදේශයේ පසු ගිය දිනක ඉදිකිරීමක් කිරීම සඳහා විශාල ගෙපලක් ඇද්දා. ඒ අවස්ථාවේදී මම 119 ට, හදිසි තොරතුරු දැනුම් දීමක් කරලා, පොලිසියෙන් ගෙන්න ගත්තා. මොකද ඊට උඩින් මාර්ගයක් තියෙනවා. අඩි තිහක පමණ ප්‍රමාණයක පස්කන්දක් ඉවත් කරල තියෙනවා. ඒ ගැන හොයා බලන්න සභාපතිතුමත් ආවා. එතන ගල් බැම්මක් දාලා දෙනවා කියලා කිව්වා. නමුත් මේ වනතුරු ඒ වගේ ඉදිකිරීමක් කරලා නැහැ. ඒ වගේම මෙය ඉදිකිරීමට සභාවෙන්වත් කිසිම අවසරයක් අරගෙන නැහැ. මොකද ඒ වගේ ඉදිකිරීමක් කරනවා නම්, මම දන්නා ආකාරයට සභාවේ අවසරය ලබාගත යුතුයි. ඒ වගේම එතන පස් ටික ඇද්දෙත්, කිසිම අවසරයක් නැතුව. ඒකත් සෙනසුරාදා දවසක. සෙනසුරාදට පස් අදින්නත් බැහැ. මොන බලපුළුවන්කාරකමකට එහෙම කරනවද කියලා මම දන්නේ නැහැ. දැන් ඉදිකිරීමක් කරනවයි කියලා, සුළු ප්‍රමාණයක ගල් විදලා කොන්ක්‍රීට් දාලා තියෙනවා. නමුත් එයාලා සභාපතිතුමත් ඉදිරියේ ප්‍රකාශ කළේ උඩ පාරට හානියක් නොවෙන්න බැම්මක් දාලා දෙනවා කියලා. මේ වැහි දවස්වල පාර නාය ගියොත්, ඌරල ගල්කැටියගොඩ මාර්ගයේ ගමන් පහසුව සළසා ගන්න පවුල් එකසිය අටක් වගේ ඉන්නවා. එහෙම වුනොත් ඒ කිසිම කෙනෙකුට ගමන් පහසුව සලසා ගැනීමට නොහැකි වෙනවා. ඒ වගේම ඒ ස්ථානයේ තියෙන ප්‍රාදේශීය සභාව සතු පොදු නාන ළිඳටත් බැකෝ යන්ත්‍ර යොදාගෙන පොදු නාන ලිඳේ භාගයක්ම වගේ පැති බැම්මක් ඉස්සරහ ළිං බක්කියත් ඒ සියල්ල කඩා විනාශ කරලා, හානි කරලා තියෙනවා. නියං කාලෙදී ප්‍රදේශයේ බහුතරයක් පාවිච්චි කරන්නේ ඒ ළිඳ. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරලා, මේ ගැන වහාම පරීක්ෂණයක් පවත්වන්න කියලා, මම ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ගස්වල ප්‍රශ්නයක් මටත් තියෙනවා. නිවාස දෙකකට ලොකු හානියක් තියෙනවා. ඔබතුමා 04 වෙනිදත් ඒ මිනිස්සු කැඳවීම් කරලා තිබුණා. ඒ ගස් කඩා වැටුනොත්, නිවාස දෙකකට දැඩි හානි සිදු වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, කරන්න පුළුවන් පිලියමක් හැකි ඉක්මනින් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. මොකද ඒ අය කියන්නේ අපිට ගස් ඕන නැහැ. එක අධිකරණයේ නඩු කටයුතු පවතින බැවින්, ඒ ගස් කපන්න කවුරුවත් කැමති

නැහැ. මොකද ලොකු මුදලක් වියදම් කරන්න වෙන නිසා. ඒක වෙන්දේසි කරන්න පුළුවන්. පාර අයිනේම තමයි තියෙන්නේ. ඔබතුමාගේ දැඩි අවධානය යොමුකරලා, ඒ අනතුරත් හැකි ඉක්මනින් ඉවත් කර දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම මට මේ අවස්ථාවේ සභාවෙන් බැහැර වීමට අවසර පතමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

- **ප.ව. 2.30 ට ගරු මන්ත්‍රී එන්.වී. පතිනායක මහතා සභාවෙන් අවසර රැගෙන බැහැරව යන ලදී.**

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ඔබතුමා යන්න කලින් මම මේකට උත්තර දෙන්න ඕන. ඌරල ඉදිකිරීම පිළිබඳව සභාවට ඇවිල්ලා කතා කළා. හිටපු උප සභාපති සරත් අබේසේකර මහතාගේ මස්සිනා, එතුමා ඇවිල්ලා කිව්වේ එතන ඉඩම ගත්තා. අපි එතන උඩ සුද්ද කරනවා. ඒ පිළිබඳ පතිනායක මන්ත්‍රීතුමාත් දැනුවත් වුණා. ඒ කුණු ටික දාන්න තැනක් දෙන්නම් කියලා. ඉතින් මම කිව්වා අපට ප්‍රශ්නයක් නැහැ. සුද්ද කරගන්න කියලා. වීපී රේඛා ගැන ඇහුවම මම කිව්වා අඩි 50ක් පාරට තියෙන්න ඕන කියලා. ඊට පස්සේ සෙනසුරාදා දවසක ඔබතුමා කතා කලා. එදා තාක්ෂණ නිලධාරීන් හිටියේ නැහැ. එනිසා මම කිව්වා පොලිසිය හරි සම්බන්ධ කරන්න කියලා. ඊට පස්සේ මමත් එතනට සම්බන්ධ වුණා. මිනිස්සු උද්ඝෝෂණය කරන්න පටන් ගත්තා. එතන උඩින් පාරෙන් කපලා තිබුනා. අපෙන් අවසර ගත්තේ නැහැ. ළිඳට හානි වුනොත් එයාලා හදා දෙනවා කියලා වාචිකව සුහදත්වයෙන් යුතුව කතා කලා. අද මේ සභාවෙ කතා කළ නිසා, මේ පිළිබඳ පරීක්ෂණයක් තියන්න මම තාක්ෂණ නිලධාරිව යවන්නම්. එදා ගෙපල් කපන කතාවක් කිව්වේ නැහැ. අද සභාවෙ කතා වුන නිසා මේකට පරීක්ෂණයක් තියන්න වෙනවා.

ඒ වගේම ඔබතුමා කියපු ගහේ ප්‍රශ්නය උභතෝකෝටික එකක්. ඒකට නඩුවක් තියෙනවා. නඩුව ප්‍රශ්නෙකුත් නැහැ. ඒ අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්. ගහ කපල අපට වෙන්දේසි කරන්න බැහැ. කවුරුත් කැමති වුනොත් පන්සලට දෙන්නත් පුළුවන්. පන්සලට දුන්නොත් එයාලා කපා ගෙන යාවි. එය විශාල ගහක් නිසා කපන්නත් අපහසුයි. මේකත් ලී මෝලකට සම්බන්ධ කරන්නත් බැලුවා. මේ ගස් ප්‍රශ්නයත් අවුරුදු ගණනක් ඉදලා ඇදෙන ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා**

ගරු සභාපතිතුමනි, හදිසි කටයුත්තක් යෙදීම නිසා මට සභාවට ඒමට ප්‍රමාද වුණා. මම මුලින්ම ගෝනදෙනිය ක්‍රීඩා පිටිය ගැන සඳහනක් කරන්නම්. මේක 1993 වෙනකම් ගෝණදෙණිය ක්‍රීඩා පිටිය සහ වී ගබඩාව තියෙන ඒ ඉඩම තිබුණෙ රජයට. නමුත් 1993 එවකට පැවති ආණ්ඩුව ඉතාම අත්තනෝමතික විදිහට සහ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව හැමදාම කරන්නේ රාජ්‍ය දේපල විකුණන එක. ඒකට හොඳම උදාහරණය මේ ගෝනදෙනිය වී ගබඩාව. මේක ඉතාමත් සුළු මුදලකට ඇප්තොප්වත්ත අයිතිකාර මහත්මයට පවරා දීමක් සිදු කරනවා. අනතුරුව මෑතකාලීනව බද්දෙගම ආසනයේ හිටපු එක්සත් ජාතික පක්ෂ ආසන සංවිධායක ආනන්ද කාරියවසම් මහත්මයා රුපියල් ලක්ෂ දහයකට වගේ මුදලකට මේ ඉඩම ලබා ගන්නවා. ඒක අපට සඳහන් කරලා එවලා තියෙනවා. මම හිතන්නේ මේ වී ගබඩාවෙ වහලෙ තියෙන ෂීට්වල වටිනාකමත් ලක්ෂ දහයක් විතර වෙයි. ගරු මන්ත්‍රීතුමා private property එකකට මහින්ද රාජපක්ෂ ආණ්ඩුව වග කියන්නේ නැහැ. එතකොට ඒක private property එකක් බවට පත්කරලා තියෙන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඔයාට දුන්නට පස්සෙ, ඔයාගෙන් ගන්න එකට ඒකට මහින්ද රාජපක්ෂ මහත්තයා

හිටියද, මෛත්‍රීපාල සිරිසේන මහත්තයා හිටියද කියන එක ගැටලුවක් නෙවෙයි. ඔබතුමා උලුප්පලා සඳහන් කරන්න පටන් ගත්තෙ මේක මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් සිදුවෙච්ච දෙයක් කියලා. කොහෙත්ම නැහැ. ඔයාගේ මගේ බිස්නස් එකක් සම්බන්ධව තියෙන ආණ්ඩුව වග කියන්න අවශ්‍යතාවයක් නැහැ. දැන් මේ වෙනකොට එහි අයිතිය තියෙන්නේ හිටපු එක්සත් ජාතික පක්ෂ ආසන සංවිධායකවරයාට. මේ වෙනවිට ඒ සම්බන්ධ කටයුතුත් එක්ක මේ ක්‍රීඩාපිටියට අයිතිවාසිකමක් ඉදිරිපත් කිරීම හා ඒ කටයුතු සිදු වෙනවා. ඉතින් මගේ යෝජනාව මේක අපට නිරාකරණය කර ගන්න බැරිනම්, ඉදිරි අපේ රජයකදී මේ වී ගබඩාව සහිත ඉඩම වන්දියක් ගෙවලා හෝ රජයට පවරා ගැනීමට කටයුතු කරමු සහ කටයුතු කරනවයි කියන එක මේ අවස්ථාවේදී මම සභාවට කියන්න ඕන. මොකද මෙම ක්‍රීඩාපිටියේ හැමදාම පනහක් සීයක් විතර සෙල්ලම් කරනවා. ඒ නිසා මේ ක්‍රීඩා පිටිය දෙන්න බැහැ. මේක ගමට විශාල වස්තුවක්. පහුගිය දවස්වල ක්‍රීඩාපිටිය ගැන තිබුන සාකච්ඡාවේදී මම දැක්කේ, එක්සත් ජාතික පක්ෂයෙන් ආපු අපේ නියෝජිතයෝ අපට, සභාවට නෙවෙයි. අර ආපු කෙනාට පක්ෂව කතා කරපු විදිහක් තිබුණා. සමහරවිට මම වැරදි වෙන්න පුළුවන්. තරංග මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේ වෙලත්, එතුමා උපක්‍රමශීලිව එදා නොපැමිණ හිටියා. පැමිණි අය කතා කළේ ඒ අදාළ පුද්ගලයාට පක්ෂව. සභාවට පක්ෂව කතා නොකරපු බවක් තමයි මට හැඟී ගියේ. මම මේ කරුණු ඉදිරිපත් කරන්නේ සභාවෙ දැනගැනීම සඳහායි.

ඊට පස්සේ මම කියන්න ඕන. ගෝනදෙනියෙ මාර්ග සම්බන්ධව හැමදාම කතා කරනවා. මේ වෙනවිට ගෝනදෙනිය මාර්ගවල කැලෑව වැවිලා. ඒ සම්බන්ධව කටයුතු කරලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම හගරන්වල පෙර පාසලේ ගුරු පුටුව ගැන කතා කළා. අද වෙනකොටත් ඒක ලැබිල නැහැ. ඒක ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද සභාවේ, අර කිව්ව වගේ ගොඩක් අනවශ්‍ය දේවල් වලට වියදම් කරනවා. එහෙම දෙන්න බැරිනම්, මට ලබාදෙන දීමනාවෙන් හෝ ඒ පුටුව ලබාදීමට කටයුතු කරන්න කියන එකත් මතක් කරනවා.

ඒ වගේම කටුපොල් වැවීම දිගටම සිදු කරනවා. කටුපොල් කර්මාන්ත ශාලාව සම්බන්ධව අපි මේ වන විට ගත්ත පියවරයන් සම්බන්ධව, දීර්ඝකාලීන කටයුත්ත පිළිබඳව අපි යම් කිසි දෙයක් ඇහුවෙ නැහැ. ළඟකදි ගොම ලොරි ගෙන ඒම සම්බන්ධව කතා කළා. ඊට පස්සේ මාර්ගයට බර නියම කිරීමට අපි කතා කළා. නමුත් ඒ සම්බන්ධව කිසි දෙයක් සිදුවුණේ නැහැ. මම හිතන්නේ අපට සල්ලි නැහැ කියලා. නමුත් සල්ලි නැති එක වෙනම ප්‍රශ්නයක්. අපි සභාවක් විදියට මිනිස්සුන්ට සේවාවක් සපයන දේවල්, මාර්ග ආරක්ෂා කරගැනීම වගේ කටයුතු කරන්න පුළුවන්. ඒ පිළිබඳ සභාපතිතුමාගේ අවධානය යොමු කරන්න කටයුතු කරන්න කියලා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

දෙවනුව මට කතා කරන්න තියෙන්නේ උඩුගම පොළ භූමිය ගැන. පසුගිය දවස්වල වැස්සත්, සුළඟත් එක්ක පොලේ වහලෙ ෂීට් හුළඟෙ ගිහිල්ලා. ඒ නිසා පාරිභෝගිකන් සහ වෙලෙන්දෝ විශාල අපහසුතාවකට පත් වෙනවා. ඒ වගේම හැමතැනම තෙමෙනවා. මේ පිළිබඳව මම මේ අවස්ථාවේදී ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අභිකුණ්ඨිකයන් නිසා ලොකු ගැටලුවක් ඇතිවෙලා තියෙනවා. ඒ සම්බන්ධවත් යම් කිසි පියවරක් ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම පොළේ තණකොල වැවිලා. කුණු ටික සුද්ද කරගන්න බැහැ. කුණු ටික දාන්නෙ කැලෑබද ප්‍රදේශවලට. ඒ නිසා අපේ සභාවෙ සේවකයන්ට ශුද්ධ කරගන්න බැහැ. ඒවා කුණුවෙලා ප්‍රදේශය අධික දුගඳක් ඇතිවන තත්ත්වයක් තමයි තියෙන්නේ. ඒ නිසා පිරිසිදු කිරීමේ කටයුතුවලට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ප්‍රධාන කරුණක් තමයි නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උඩුගම තියෙන උඩුගම මහජන ක්‍රීඩාංගනයේ තියෙන විවේකාගාරය මේ වනවිට සම්පූර්ණයෙන්ම අබලන් වෙලා තියෙනවා. සිවිලිම කොයිවෙලේ ඔලුවට කඩාගෙන වැටෙයිද දන්නෙ නැහැ. ඒ වගේම දොරවල් කැඩිලා. ලයිට්, ස්විච් මොකුත් නැහැ. පිට්ටනියෙ තිබුන ගේට්ටුවත් වෙන්දේසි කළා මිසක්, වෙනත් ගේට්ටුවක් නැවත සකස් කරන්න කටයුතු කළේ නැහැ. මේ ගේට්ටුව

සකස් නොකිරීම නිසා දැන් උඩුගම මහජන ක්‍රීඩාංගණය වෙළෙන්දන්ගේ බඩු හුවමාරු කිරීමේ මධ්‍යස්ථානයක් බවට පත් වෙලා තියෙනවා. පොහොර, ලී ගෙනැල්ලා බෙදාහරින්නේ මෙතනින්. ගරු සභාපතිතුමනි, මහජනතාවට සේවා සලසන මහජන ක්‍රීඩා පිටියක තත්වය මේකද? හොඳම උදාහරණයක් විදියට ගත්තොත්, බද්දේගම කුම්මේ ක්‍රීඩාංගණය මඩ වෙනවයි කියලා අඩුම ගානේ සංගීත සංදර්ශනයක් පවත්වන්නවත් දෙන්නේ නැහැ. අපේ උඩුගම මහජන ක්‍රීඩාංගනයට මේ වගේ ඉරණමක් අත්කර දීම ගැන කනගාටුවට පත් වෙනවා. වටේ තියෙන දැල් තණකොළ වලින් සම්පූර්ණයෙන්ම වැහිලා. ඉතින් ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊට අමතරව මට ඉල්ලීම් කිහිපයක් කරන්න තියෙනවා. දූරියන් ගහ ගැන කතා කරනවා නම්, මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. ඒකෙ අතු ටිකවත් කපලා, දින කීපයක් ඇතුළත යම් තරමකට අවදානම අඩු කිරීමට කටයුතු කරන්න කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම උප කාර්යාල භූමිය අපවිත්‍ර වෙලා තියෙනවා. පහුගිය දවස්වල සුද්ධ පවිත්‍ර කිරීම් කරලා තිබුනා. නමුත් නිතරම එතන නඩත්තු කිරීම සඳහා කෙනෙක් පත් කරලා තියාගන්න පුලුවන්නම්, නිතර අපවිත්‍ර වෙන එක නවත්තගන්න පුළුවන් කියන එකත් මතක් කරනවා. ඒ වගේම උඩුගම දකුණේ තියෙන ක්‍රීඩාපිටිය ගැන ඔබතුමාට කතාකරලා කිව්වා. මටත් නිතරම ඉල්ලීම් එනවා. ඔබතුමාටත් ඒ ගැන ඉල්ලීම් ආවා. ඒ ක්‍රීඩාපිටියේ වල්බිහිවෙලා. උඩුගම ගෝනදෙනියත් මම සකස් කළා. නමුත් මේ වෙද්දි එයත් වල් බිහිවෙමින් තියෙනවා. ඒ වගේම මාපලගම ක්‍රීඩාපිටිය ගත්තම, මේ වෙන විට ගල් ටික ඉවත් කරලා කියලා මම හිතන්නේ නැහැ.මාපලගම ක්‍රීඩා පිටියත් ඒ තත්වයෙන්ම පවතිනවා. ඒ නිසා මේ ක්‍රීඩාපිටි සහ සභාව සතු දේපළවල නඩත්තුව පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා, ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ගම්වල නාමපුවරු ගහලා තිබුණා. දැන් මේ වන විට ඒවා අබලන් වෙලා. ගෝණදෙණියෙ සහ තවත් කිහිප තැනකම නාම පුවරු ප්‍රතිසංස්කරණය කරන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මම මේ කරන්න යන යෝජනාව සම්බන්ධව සමහරවිට ඔබතුමා කියාවි. මේක අපට අදාල නැහැ. අපි ආයතනයක් විදිහට ලාභ ලබන ආයතනයක් නෙවෙයි. ජනතාවට සහ රටට යම්කිසි සේවාවක් කරන ආයතනයක්. ඉතින් මම මේ යෝජනාව කරනවා. කන්නෙලිය ආශ්‍රිත ප්‍රදේශයේ කුණු ටික බැහැර කර ගන්න අපට යම්කිසි මුදලක් කලින් ගෙව්වා. ඊට පස්සේ අපි ඒ මුදල වැඩි කල නිසා ඒ මුදල් ගෙවීමට ඇති නොහැකියාව නිසා කුණු ගන්න එක නැවැත්තුවා. නමුත් මේකෙන් විශාල පරිසර හානියක් සිදුවෙනවා. ඒ කුණු මුදාහරින්නේ පරිසරයට. ඒ වගේම කන්නැලිය අවට තියෙන හොටෙල් වල කුණු ටිකත් අපි ඒ දවස්වල අරගෙන ආවා. දැන් ඒ සියලුම කුණු මුදා හැරෙන්නේ කන්නැලිය රක්ෂිතයට. අපි පහුගිය දවස්වල තරුණ සංවිධානයක් එක්ක එකතු වෙලා එම ප්‍රදේශවල පිරිසිදු කිරීම් කටයුතු කළා. ඒ එකතු කරපු කුණු ටික රගෙන ඒමට සභාපතිතුමා මට උදව් කළා. ඒ වෙනුවෙන් මම ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරනවා. ඒ වගේම අපට සේවාවක් විදියට මේක කරන්න පුලුවන්නම්, රටට, පරිසරයට, සමාජයට කරන සේවාවක් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕන. ඒ වගේම කැටගොඩ බස් නැවතුම්පොළ ගැන කතා කළා. කැටගොඩ බස්නැවතුම්පොළ අසල තියෙන වැසිකිලි පද්ධතිය දැනට මාස කිහිපයකට කලිනුත් කතා කළා. නමුත් අපට ප්‍රාදේශීය සභාවෙන් කරන්න හැකියාවක් නැති වුණත්, මේ සුද්ධ පවිත්‍ර කිරීම් කරනවා නම්, පළාත් සභාවෙන් ගෙවීමක් කරන්න පුළුවන් කියලා දැනුම් දුන්නා. නමුත් ඒකත් අපට මග හැරුණා. මේ වෙද්දි ශුද්ද පවිත්‍ර කිරීම් කරලා තියෙනවා කියල තමයි මට දැනගන්න ලැබුණේ. ඒ නිසා එය නඩත්තු කරන්න එතනට එන අයකුගෙන් මුදලක් හෝ අයකරගෙන, යම්කිසි වැඩපිළිවෙළක් කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, කටුපොල් ව්‍යාප්ත කිරීම පිළිබඳව ගාලු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති සාකච්ඡාවේදී, අපේ ප්‍රාදේශීය ලේකම්තුමිය අපේ ප්‍රදේශයේ කටුපොල් අලුතෙන් නැවත වගා කිරීමට විරෝධතාවය ප්‍රකාශ කරලා තිබුණා. ඒ වගේම ප්‍රදේශයේ අද කටුපොල් වගා කරනවා. ඒ විතරක් නෙවෙයි දැන් කටු පොල් නිෂ්පාදනය වැඩිවෙනකොට කටුපොල් කර්මාන්තශාලාවෙ ධාරිතාව වැඩි කරන්න අවශ්‍යතාවයක් වෙලා තියෙනවා. ගේන කටුපොල් අඹරන්න කර්මාන්තශාලාවේ ධාරිතාව මදි. එහෙමනම් ධාරිතාව වැඩිකර ගන්න අනුමැතිය ගන්න වෙයි. ඒ සඳහා සම්පූර්ණ විරෝධතාවය ප්‍රකාශ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ උප සභාපතිතුමා බොහොම පැහැදිලි ලෙස ගෝනදෙනිය පිට්ටනියෙ නඩුව ගැන කතා කළා. මම හිතන්නේ ඔය ගෝණදෙණියේ පිට්ටනිය සම්බන්ධව, ආනන්ද පද්මසිරි කාරියවසම් මැතිතුමා මොන දේශපාලන පක්ෂයේ හිටියත්, බොහොම වැදගත්කමට රටට, ඉඩකඩම් දේපල දීපු හොඳ සමාජ සේවක මහත්තයෙක්. ඒ නිසා මේ ප්‍රශ්නය උසාවියට යන්න නොදී, විශේෂයෙන්ම තරංග මන්ත්‍රීතුමා, ධනංජය මන්ත්‍රීතුමා, කොට්ඨාසයේ මන්ත්‍රීතුමිය ඒ සියලු දෙනා කතා කරලා ප්‍රශ්නය ගොඩින් බේර ගන්න පුළුවන් නම් හොඳයි. උසාවි ගියත් කියන්න දෙයක් නැහැ. ඊට වඩා එතුමත් එක්ක සුහදව කතා කරලා මේ ප්‍රශ්නේ විසඳා ගන්න පුළුවන් වෙයි. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ඔය ක්‍රීඩාපිටියේ යම් ප්‍රශ්නයක් ඇති වුණොත්, තරංග මන්ත්‍රීතුමා ඔබතුමාලයි කොට්ඨාශයේ මන්ත්‍රීවරුන්ට විශේෂයෙන් නරක නාමය එනවා. ගරු සභාපතිතුමනි, අද දින ඔබතුමා සාර්ථකව සභාව පවත්වලා, ලබන සභාව වන විට ඇල්පිටිය ජයග්‍රහණය කරලා ඊළඟ පියවර තබනවා. එම ප්‍රතිඵලය මත අපි අලුත් ජනාධිපති කෙනෙක් ලෙස ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති පුටුවේ ඉන්දවන්න සූදානම් වෙනවා. ඒ සඳහා අපේ නෙලී මන්ත්‍රීතුමිය, අජිත් මන්ත්‍රීතුමා ඇතුළු අපේ ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් සහයෝගයක් ලැබෙනවා කියලා අපි දන්නවා. තවම එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙක්වත් දන්නෙ නැහැ. ඒ පිළිබඳවත් සතුට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින්, ඔබ සියලු දෙනාට සුභ සන්ධ්‍යාවක් ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**ගරු මන්ත්‍රීනි ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ඇත්තටම අද කතා නොකරන්න හිටියත් කතා කරන්න හිතුනා. විශේෂයෙන්ම පහළොස් වැනිදා ගම්පෙරළිය යටතේ විවෘත කරන්න යන සියලුම දේවල් පිළිබඳව, අපේ තරංග මන්ත්‍රීතුමන්ලා සතුටු වෙනවා වගේම, ඇත්තටම අපි හදවතින් කණගාටු වෙනවා. මොකද ගම්පෙරළිය යටතේ, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මගින් විශාල මුදලක් ලබාදීලා තිබුනත්, සමහර තැන්වල යම් යම් අක්‍රමිකතාවයන් සිදුවෙලා තියෙනවා. මොකද එහෙම කියන්න හේතුව ප්‍රදේශ තෝරා ගැනීම තුළදී අත්‍යවශ්‍ය ස්ථානවලට මුදල් වැය කිරීමක් සිදු වෙන්නේ නැහැ. අපේ කොට්ඨාස තුළ මේ යටතේ විශාල වැඩ කොටසක් සිදු වෙලා නැහැ. විශාල මුදලක් වැයවෙනවත් සමගම කොට්ඨාස මට්ටමින් හැම කොට්ඨාශයකටම යමක් කෙරෙනවා නම් ඒ පිළිබඳව අපට සතුටු වෙන්න පුළුවන්. නමුත් අපට සතුටු විය නොහැකි නිසා ඒ ගැන බලවත් සේ කනගාටුවට පත් වෙනවා. ඒ වගේම ගම්පෙරළිය යටතේ ප්‍රදේශයේ පාරවල් සකස් කිරීමේදී අපි බලාපොරොත්තු වෙන්නේ ප්‍රධාන පාරවල් සංවර්ධනය කරන්න. ගෙවල් දෙක තුනකට යන්න තියෙන පාරවල් වලට වැඩිය ප්‍රධාන පාරවල් ටික හදාගත්තනම් ගොඩක් වැදගත් වෙනවා. ඒ නිසා ගම්පෙරළිය යටතේ කරපු වැඩ පිළිබඳව පිරිසක් සතුටු වෙනවා වගේම අපට බොහොම කණගාටුදායකයි. ඒ වගේම ගම්පෙරළිය හෝ කුමන හෝ ව්‍යාපෘතියක් යටතේ දොරනවිල පාර සකස් කරලා දෙන්න. ඒ වගේම මාපලගම ගාල්ල ප්‍රදේශයට ගමන් කරන ප්‍රධාන මාර්ගයක් වන සැන්ඩො

කඩේ මාර්ගයේ අනතුරුදායක තත්ත්වය පිළිබඳව මම සභා වාර කිහිපයකදීම කතා කලා. දිගින් දිගටම එවැනි දේවල් කතා කරන විටදිවත්, ගම්පෙරළිය යටතේවත් ඒ වැඩ කොටස නොකිරීම පිළිබඳව මම බලවත් සේ කනගාටුවට පත් වෙනවා. ඒ වගේම නාගොඩ වත්ත පාර විශාල පිරිසක් ගමන් ගන්නා පාරක්. සංවර්ධන ගම්මානය 70 කන්ද ඒ වගේ ගම්මාන කිහිපයකට පිවිසෙන මාර්ගය. ඒ පිළිබඳව මම කිහිප වතාවක්ම සඳහන් කළා. නමුත් එහෙම කිසිම කාර්යයක් සිද්ධ නොවුණු අවස්ථාවක, දකුණු පළාත් සභාවේ හිටපු නියෝජ්‍ය සභාපති, හිනිදුම ආසනයේ පොදුජන පෙරමුණේ ප්‍රධාන සංවිධායකතුමා වන සම්පත් අතුකෝරළ මැතිතුමා රුපියල් ලක්ෂ 10ක මුදලක් වැය කරමින් මේ දවස්වල ඒ පාරේ වැඩ කටයුතු සිදු කරනවා. ඒ අවස්ථාවලදී අපේ සභාපතිතුමා අපට විශේෂ අනුග්‍රහයක් ලබා දුන්නා. ඒ පිළිබඳවත් මේ අවස්ථාවේදී එතුමාට ස්තුති කරනවා.

ඒ වගේම සමෘද්ධි කටයුතු සම්බන්ධව කතා කිරීම තුළ විශේෂයෙන්ම කැප්පිටියගොඩ සමෘද්ධි නාමලේඛනයේ උඩින්ම තිබුනේ වැගන්ආර් කාර් එකක් තියෙන කෙනෙක්ගෙ නමක්. ඇත්තටම ඒ පිළිබඳව මම තවදුරටත් සොයා බලනවා. පැහැදිලිවම ඒක මට පෙන්නන්න පුළුවන්. මොකද මගේ හොඳම යාළුවෙක්. මම නම සඳහන් කරන්නේ නැහැ. අපේ නිලධාරීන්ට ඕන විදිහට සමෘද්ධිය හදන්න දුන්නේ නැහැ. සමෘද්ධිය හදනකොට සමෘද්ධිය හදන්න යවලා තියෙන්නේ අපේ වෙනත් කෙනෙක් ළඟට. අපේ කොට්ඨාශයේ එතුමා ළඟට ගිහිල්ලා තමයි සමෘද්ධිය හදලා මෙහේට ගෙනත් දෙන්න කියන එක කියලා තියෙන්නෙ. ඒ නිසා කොට්ඨාසයේ නිලධාරීන්ට අපි කවදාවත් දොස් කියන්නේ නැහැ. වෙනත් ආකාරයකට තමයි ඒ සමෘද්ධි වැඩසටහන කරගෙන ගිහිල්ලා තියෙන්නේ. ඉතින් සමෘද්ධිය ලබාදීම තුළිනුත්, තමුන්නාන්සේලාගේ රජයට බලපෑමක් ඇති වේවි කියලා මම කියනවා. කවදහරි දවසක මහජනතාව විසින් තීරණයක් ලබාදේවි. ඒ වගේම සංවර්ධන කටයුතු පිළිබඳ සතුටු වෙන ගමන්, ගම්වල සංවර්ධනය කරන කොට එය අවශ්‍ය ස්ථානයක් බලලා කරනවා නම් තමයි වැදගත් වෙන්නේ. මීටර් පනහක් සීයක් කොන්ක්‍රීට් කරලා, බෝඩ් ලෑලි ගැහුවට සාධාරණ නැහැ. අපේ ප්‍රදේශයේ මීටර් සීයක් විතර සංවර්ධනය කරලා ගම්පෙරළියට යටතේ බෝඩ් එක ගහල තියෙනවා. ගම්පෙරළිය යටතේ ගම් පෙරළන්න පුළුවන් වැඩසටහනක් කරනවා නම් එක තමයි වැදගත් වෙන්නේ. කෙසේ වෙතත් ජනතාව වෙනුවෙන් යමක් කරනවා නම් ඒ පිළිබඳව සතුටු වෙනවා. ඒ වගේම මේ අවස්ථාව ලබා දීම ගැන ගරු සභාපතිතුමාට ස්තුති වන අතර, ඔබ සියළු දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රීනි අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමනි ඔබතුමාගෙන් පොඩි ප්‍රශ්නයක් අහන්න තියෙනවා. මම හිතන්නේ අපි සභාවෙ ව්‍යවස්ථාව අනුව දින තියෙද්දි තමයි මම ගියවර සභාවට යෝජනා දුන්නෙ. කුමන හේතුවක් නිසාද දන්නේ නැහැ. මගේ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළු කරලා තිබුණෙ නැහැ. මට න්‍යායපත්‍රය ලැබුනම මම ලේකම්තුමියගෙන් ඒ ගැන විමසුවම, මීට කලින් ඇතුලත් කරලා තිබුන නිසා මේ යෝජනා ඇතුළත් කරන්න ඕන නැහැ කියලා මිනිට් එකක් ගහලා තිබුන කියලා කිව්වා. එසේනම් ගරු සභාපතිතුමනි මේ යෝජනා කුමන වර්ෂයේද? කුමන දවසක කවුරුන් විසින් යෝජනා ඉදිරිපත් කර තිබේද කියලයි මට දැනගන්න ඕන. සංවර්ධනය සඳහා වූ තිරසාර සංවර්ධන අරමුණු සඳහා වූ 2030 න්‍යාය පත්‍රයේ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශනය තුළින් අප සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා දිගුකාලීන සැලසුම් සඳහා පියවර ගෙන තිබේද? ඒ පිළිබඳ විස්තර වාර්තාවක් සෑම සභිකයකුටම ලබා දෙන්න කියලා තමයි මම යෝජනා කළේ. ඒ ගැන ලේකම්තුමියගෙන් විමසුවම, ලේකම්තුමිය කිව්වෙ, විෂයට අදාල නිළධාරීතුමිය දැනුවත් කරලා, විෂයෙන් කරුණු අරගෙන කියනවා කියලා. ඒ වුනාට සභාපතිතුමා විසින් 2020 අය වැය යෝජනාවලිය කියවීම නිසා මම ඒ ගැන දැනුවත් වුනා. නමුත් මම අහන්නේ ඇයි ඒ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළේ කියලා.

ඊට පස්සේ දෙවන යෝජනාව විදිහට ගෝණදෙණියේ යහලදූවවත්ත ඒකනම් සඳහන් වෙලා තිබුණා. තෙවන යෝජනාව ලෙස වාඩියකන්ද රක්ෂණ ගම්මානයට පිවිසෙන මාර්ගයේ ඇලකන්ඩියේ ඇති විශාල වලවල් ගොඩ කිරීම සුදුසු යැයි මම යෝජනා කළා. ගරු සභාපතිතුමා ගෝනදෙනිය යහලදූවවත්ත මාර්ගයේ සිට මොරගල්මුල්ල ගම්මානය දක්වා දිවෙන මාර්ගය ඉතාම අබලන් තත්වයේ පවතින බැවින්, බැකෝ යන්ත්‍රයක් යොදා මාර්ගය ජනතාවට ගමන් කිරීමට පහසු ආකාරයට පිළිසකර කිරීම සුදුසු යැයි යෝජනා කරනවා. මේ යෝජනාව කලින් දාපු නිසා ඒක අයින් කරගන්නවා. පලවෙනි යෝජනාව සම්බන්ධ විෂය විසින් කරුණු ඉදිරිපත් කරයිද? අපිත් පක්ෂයක් එක්ක ගනුදෙනු කරනවා. ඇයි මේ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් නොවෙන්න කියලා පක්ෂය විසින් අපෙන් ප්‍රශ්න කරනවා. අපිත් උත්තර බඳින්න ඕන. මගේ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් නොවෙච්ච තුන්වැනි අවස්ථාව මේක. ඉතින් ඇත්තටම මම ඒ ගැන කණගාටු වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, වර්ෂ තුනක විගනන වාර්තා මම අධික්ෂණය කලා. වර්ෂ තුනක් තිස්සේ එකම කරුණ කියවුනා. අපේ සභාව සතු ඉඩම් පිළිබඳව තමයි වර්ෂ තුනේම වාර්තාවල තිබුණේ. මේ වන තෙක් කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. නමුත් මේ සැරේ ඒවා විගණනය කරන්න ක්‍රියාමාර්ග අරන් තියෙනවා. මම ඇත්තටම ඒ ගැන සතුටු වෙනවා. ඔබතුමා විගණන වාර්තාව කෙරෙහි අවධානය යොමු කරනවා. මම ගිය සභාවාරවලදිත් කිව්වා. විශේෂයෙන්ම විගණන වාර්තාවේ ගොඩක් අඩුපාඩු තියෙනවා. මම හිතන්නේ අපේ වැඩිම වශයෙන් අඩුපාඩු තියෙන්නෙ ලේකම් පාලන කාලයේ. මෙවරත් අඩුපාඩු ටිකක් විතර තියෙනවා. ඒ වගේම තමයි අපේ ආදායම් අඩුවීම, හිඟ ආදායම් දිගින් දිගටම පැවතීම, ඒවා ගැන අවධානයක් යොමු කරල නැති තත්ත්වයක් තියෙනවා. පොළේ හිඟ වාරික වගයක් තියෙනවා. පහුගිය දවස්වල හිඟ වාරික වලට නඩු දානවා කියලා ප්‍රශ්න ඇති වුණා. ඒවට දැන් අරගෙන තියෙන්නේ මොන වගේ ක්‍රියාමාර්ගද? ඒ හිඟ වාරික ලබාගෙන තියෙනවද? කියන එකත් දැනගන්න කැමතියි.

ඒ වගේම අපේ පාරවල් වල යන්න බැරි තත්ත්වයක් උදාවෙලා තියෙනවා. කිසි සංවර්ධනයක් වෙන්නේ නැහැ. අපි පාරට බැස්සම මිනිස්සු අපට කියන්නේ, අපේ පාරවල් ටික වත් සුද්ධ කරලා දෙන්න කියලා. ඒ වෙලාවට සභාවේ සේවකයන් අඩුයි කියන එක තමයි අපි හැමදාමත් කියන්නෙ. නමුත් අපට හැමදාම එකම කියන්න බැහැ. අපේ සේවකයෝ කොහේ කොහේ හරි වැඩ කරනවා. පොළේ හැමදාම වැඩ කළත්, පොලේ කටයුතු වැඩිදියුණු වෙලා නැහැ. පිට්ටනිවල කිසිදු පිරිසිදුකමක්වත් පේන්න නැහැ. මාපලගම පිට්ටනියේ තුත්තිරි ගොඩක් පේනවා. මීට මාස දෙකකට පෙර පිරිසිදු කිරීම් කළා. නමුත් අවුරුද්දකින් විතර වැඩ කරපු නැති විදියක් තමයි පේන්න තියෙන්නේ. ඒ කාර්යයන් පිළිබඳ අධීක්ෂණයක් සිදුවෙලා නැහැ. මම ඔබතුමාට වරද පටවනවා නෙවෙයි. නිලධාරීන් වැඩ කරනවද නැද්ද කියල අධීක්ෂණයක් කරන්න. සභාපතිතුමා අනුන්ගේ වැරදි ටිකක් තමන් අරගෙන ඔබතුමාම චෝදනාවන් ගන්නවා. ඔබතුමා අධීක්ෂණයක් විතරක් කරන්න. මම මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. සියලු දෙනාටම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, කාල වේලාව ඉක්ම ගියත්, මමත් ටිකක් කතා කරන්න ඕන. මොකද හැමෝම කතා කරන්නේ එකම දෙයක් ගැන. හැමෝම හැම අවස්ථාවකදිම ඇඟිල්ල දික් කරන්නේ එක පැත්තකට. ඒ වුණාට අපි දිහාට තවත් ඇඟිලි දික් වෙනවා. ඒ නිසා මේ සභාවේ මන්ත්‍රීවරු හැටියට, අපිටත් යම් කාර්යයක් තියෙනවා. ඒ වගේම සභාවේ පහළම සේවකයින්ගේ ඉඳලා ඉහළම සේවකයා

දක්වා ලොකු කාර්ය භාරයක් පැවරෙනවා. ඒ නිසා මම දකින්නේ අඳුරේ අතපත ගැමක් වගේ වැඩ කටයුත්ත තමයි මේ හැම දෙනාම කතා කරන්නෙ. මේ කොට්ඨාශයෙන් පත්වුණ හෝ පත්කරපු අපි සියලු මන්ත්‍රීවරුන් සභාවාරයට පමණක් සීමා වෙච්ච දෙයක් නෙවෙයි. මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධූරය කිව්වම, මේ පළාත් පාලන පනතක් සම්මත කරලා මම හිතන්නේ සියලුම රාජ්‍ය ආයතන අභිබවා යන විදියේ වැඩ කොටසක් කරන්න පුළුවන් ආයතනයක් හැටියට නිර්මාණය වෙලා තියෙනවා. ඒ නිසා මම හිතන්නේ සැහෙන වැඩ කොටසක් කිරීමේ හැකියාව අපට තියෙනවා. මේ සඳහා එක්කෙනෙකුට දෙන්නෙකුට හෝ සභාපතිතුමාට පමණක් මේ කාර්යය කරන්න බැහැ. ඒකට අපි සියලු දෙනාම සූදානම් වෙන්න ඕන. කලින් ප්‍රාදේශීය සභාව නියෝජනය කරන කොට කොට්ඨාස හය හතකට ග්‍රාම නිලධාරී වසම් අටකට දහයකට වගේ තමයි එක මන්ත්‍රීවරයෙක් බිහිවුනේ. නමුත් මේ අවස්ථාව වන විට හැම කොට්ඨාශයකටම මනාප ලබාගෙන හෝ ජාතික ලැයිස්තුවෙන් හෝ කොට්ඨාසයකට දෙන්නා තුන්දෙනා වෙන්න මන්ත්‍රීවරුන් පත් කරල එවලා තියෙනවා. මේ සභාව රැස් වෙලා ගන්නා වූ තීන්දු තීරණ අනිවාර්යෙන් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම මේ සභාවේ සිටින සියලු නිලධාරීන්ගේ කාර්යභාරයක් වෙනවා. ඊළඟ සභාව වෙනකන් ඉන්නෙ නැතුව, මේ සභාවේ කෙරෙන කටයුතු පිළිබඳව මේ සභාව අවසන් වූ වහාම සතියකින් දෙකකින් ඊළඟ සභාවට යන්නේ නැතුව මෙහිදී සිදු වුණ ඒවට උත්තර සපයමින් ඒ සඳහා වූ යම් යම් කාර්යභාරයක නිරත වෙනවා නම්, ගොඩක් ප්‍රශ්න වලින් මිදීමේ හැකියාව අපට තියෙනවා. අපේ සභාව ගත්තම අඩුආදායම්ලාභී සභාවක් හැටියට ආදායම් ලැබෙන්නේ මේ පොළවල් ටිකෙන්. ඒ වගේම අපට මේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුල, නාගොඩ බල ප්‍රදේශයේ සම්පූර්ණ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව නිර්ණායකයක් නැත්නම් සැලසුම් සකස් කර ගැනීමේ වගකීම සහ අයිතිය තියෙන්නේ මේ ප්‍රාදේශීය සභාවට. ඒ නිසා මම විශ්වාස කරනවා. ඉදිරියේදී අපි යෝජනා කරනවා. මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමගත්, මේ ප්‍රාදේශීය සභාවත්, ඒ වගේම මහජනයාගේ අදහස් අරගෙන මේ නාගොඩ නගරය කුමන ආකාරයට සංවර්ධනය කල යුතුද පිළිබඳව කතිකාවතක් කරලා, ඒ සඳහා අවශ්‍යතාවය සලසන්න. ඒ වගේම උඩුගම ප්‍රදේශයේත් මාපලගම ප්‍රදේශයේත් අදාළ නගර සංවර්ධනය විය යුතු ආකාරය පිළිබඳව දල සැලැස්මක් අපට තිබිය යුතුයි. ඒ වගේම මාපලගම නගරයට ලක්ෂ 100 ක ප්‍රතිපාදන මුදල් ලැබිලා තියෙනවා. යම් නිර්ණායකයක් හඳුනාගෙන තිබුණ නම්, අපට මේ සඳහා නිරන්තරයෙන් සාකච්ඡා කළ යුතු වෙන්නේ නැහැ. ඒ නිසා අපි මේකට මැදිහත් වෙන්න ඕන. එනිසා අපට දළ සැලැස්මක් තියෙන්න ඕන. මොන ආණ්ඩුව පැවතියත්, අපි ගම් වලින් සැදුම්ලත් කණ්ඩායමක් මේ ස්ථානයට එවලා තියෙන්නේ අපේ පුරවරයේ ඒ කාර්යයන් සාර්ථක කරගන්න. ඒ නිසා අපට ඒ සඳහා වගකීමක් සහ යුතුකමක් තියෙනවා. අදාල බල ප්‍රදේශය පිළිබඳ යම් සංවර්ධන සැලැස්මක් සිදුවෙනවා නම්, ඒ සංවර්ධන සැලැස්ම අනුව කටයුතු කරන්න ලේකම්තුමිය ප්‍රධාන නිලධාරීන් සියලුම දෙනාට සහ සභාපති හා ප්‍රධාන පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් සියලු දෙනාට ඒ සම්බන්ධව වගකීමක් තියෙනවා. පැවැති සෑම රජයකින්ම විශාල සංවර්ධන ප්‍රමාණයක් මේ ගම්වලට සිදුවුණා. නමුත් ඒ සංවර්ධනය නිවැරදි ක්‍රමවේදයක් නොමැති නිසා, ඔප්නැංවිලා පෙනෙන්නේ නැති වුණා. ඒ නිසා අපට ඒ සඳහා ලොකු අභියෝගයක් තියෙනවා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ තියෙන පළවෙනි කාර්යය වෙන්නේ, අදාල සංවර්ධනය කළ යුතු ක්‍රමවේදය සහ ඒ සියලු දේවල් ලබා ගනිමින් අපට ඒ කටයුත්ත සිද්ධ කරන්න මම මේ වෙලාවේ නැවත වතාවක් සිහිපත් කරනවා. ඒ වගේම සභාවේ ආර්ථික තත්වය ඉතා අඩු මට්ටමක තියෙන්නේ. අපි කවුරුත් එකතුවෙලා ඔය ප්‍රශ්නයට විසඳුම් හොයන්න ඕන. අද දිනයේදී හොඳ යෝජනා කිහිපයක්ම ඉදිරිපත් වුණා. පොළවල් ටිකට වෙන වෙනම ටෙන්ඩර් කැඳවන්න අවශ්‍ය අවකාශ සලසන්න. අපේ පොළවල් ටික හරියට කරගත්තොත් ආදායම තර කරගැනීමේ හැකියාව තියෙනවා. ඒ නිසා අපි ගරු සභාපතිතුමාට යෝජනා කරනවා. අපට තියෙන සම්පත් ප්‍රයෝජනයට අරගෙන ආදායම් උත්පාදනය කරන්න පුළුවන් වැඩපිළිවෙළක්, ඉතාමත් ඉක්මනින්ම අපි සියලු දෙනා සාකච්ඡා කරලා, ආදායම් උත්පාදන මාර්ගයකට නොගියොතින්, ඊළඟ සභාවලදී අපට ලැබෙන

දීමනාව, සේවකයන්ට ලැබෙන ගමන් වියදම්, අතිකාල දීමනා සියල්ල අඩපණ වෙනවා. අපේ ආදායම ගැන අපි නොසිතුවොත් අපට කිසි දෙයක් කරගන්න බැරි වෙනවා. කොහොමත් පිටින් සල්ලි ගන්න අපට හැකියාවක් නැහැ. ව්‍යාපෘති සඳහා මුදල් ලබාගැනීමේ හැකියාව තියෙනවා. නමුත් අපි පරිපාලනමය කටයුතු කර ගැනීම සඳහා යම් විධිමත් වැඩපිළිවෙළක් අපි දීර්ඝකාලීනව කළ යුතුයි. ඒ නිසා අපට කරන්න පුළුවන් වැඩ ගොඩක් තියෙනවා. ඒ සඳහා අපි සියලුදෙනා එකා වගේ එකතු වෙලා, මේ කාර්යය සඳහා ශක්තිය, ධෛර්යය ලබා ගන්න කියන එකත් සිහිපත් කරනවා.

ඒ වගේම ලෝක ළමා දිනය සඳහා ලොකු වැඩ කොටසක් සූදානම් කරලා තියෙනවා. පෙර පාසල් ආශ්‍රිතව චිත්‍ර තරඟයක් කරන්න අපි යෝජනාවක් ගෙනාවා. අපි ඒ සඳහා සභාවෙන් මුදල් බලාපොරොත්තු වෙන්නේ නැහැ. සභාව විසින් ඒ යෝජනාව අනුමත කළා. මේ සඳහා සම්බන්ධ වෙන්න අපේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන්ට ගෞරවයෙන් ආරාධනා කරනවා. අපි සියලු දෙනා ඉතා නුදුරු දිනයකදී ඒ පිළිබඳ සාකච්ඡාවක් පවත්වලා, ඒ සඳහා අනුග්‍රහක භවතුන්ගේ අනුග්‍රහයත් ලබාගෙන, අපි සභාවක් හැටියට යමක් කරමු. කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, ප්‍රාථමික ආදී වශයෙන් තුන් ආකාරයකින් පාසල් ළමුන් සඳහා චිත්‍ර තරගයක් පැවැත්වීමට බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අවශ්‍ය පහසුකම් ටික සලස්වා දෙන්න. ඒ වගේම අපේ නන්දන මන්ත්‍රීතුමා ප්‍රධාන ඒ මන්ත්‍රීතුමන්ලාගේ මැති, ඇමතිවරුන්ගේ සහයෝගයක් අරගෙන ළමයින්ට ත්‍යාග ලබා දීම සඳහා අවකාශ ලබා දෙන්න. ගරු සභාපතිතුමා ප්‍රධාන අපේ මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය ශක්තිය ලබා දෙන්න කියන ගෞරවනීය සිහිපත් කිරීමත් කරමින් ,මට අවස්ථාව ලබාදීම පිළිබඳව ගරු සභාවටත්, ගරු සභාපතිතුමාටත් ස්තූතිය ප්‍රදානය කරමින්, මම නිහඬ වෙනවා. ඔබ සැමට ස්තුතියි.

- **ප.ව. 03.50 ට ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා සහ ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා නැවත සභාවට පැමිණෙන ලදී.**

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, අවසර රැගෙන සභා ගැබෙන් පිටවී ගිහිල්ලා, නැවත ඒමට පොඩ්ඩක් පරක්කු වීම පිළිබඳව පළමුවෙන්ම සමාව භජනය කරනවා. හෝමදොල වත්තේ කටුපොල් පිළිබඳව කතා කරනවා නම්, වැවිලි සමාගම වවපු කටුපොල් ධාරිතාව දැනට පවතින කටුපොල් කර්මාන්තශාලාවේ අවශ්‍ය කරන නිෂ්පාදනය කරගන්න බැරි තත්වයට පත්වෙලා තියෙනවා. ඒ තුළ කටුපොල් කපන කම්කරුවෝ යම් යම් අසීරුතාවයන්ට පත්වෙලා තියෙනවා. ඒකට හේතුව තමයි දළ වශයෙන් ගත්තම ලක්ෂ එකහමාරක් අඹරන්න ඕන. මේ වතුකරයේ වැවිලි සමාගම විසින් වවපු කටුපොල් ධාරිතාව ලක්ෂ දෙකක නිෂ්පාදනයක් සිදු වෙනවා. දැන් ඒ අයගේ ඊළඟ බලාපොරොත්තුව තමයි නිශ්පාදනය ලක්ෂ දෙකහමාරක් පුළුවන් කර්මාන්තශාලාවක් බවට පත් කිරීම. ගරු සභාපතිතුමනි, අපි හැමදාම මෙතනදි මේ කටු පොල් කර්මාන්තශාලාව ගැන කතා කලත්, අපිට මේකට කිසිම බලපෑමක් කරන්න හැකියාවක් ලැබුණේ නැහැ. මම හිතනවා මෙන්න මේ ධාරිතාව වැඩි කිරීම යන කරුණ තුළ අපට පුළුවන් යම්කිසි ස්ථාවර තැනක ඉන්න. අද ඒ වැඩ කරන කම්කරුවන් ඉතා අසරණතාවයට පත්වෙලා ඉන්නවා. ඒ අය මහන්සිවෙලා කටුපොල් කිලෝ එකක් කපල ඒ අයට ලැබෙන මුදල ලබාගන්න කර්මාන්තශාලාවට යැව්වට පස්සේ, ඒක කුණු වුණා කියලා එයාලගේ වැටුප ගෙවන්නේ නැති තත්ත්වයට පත්වෙලා තියෙනවා. අපි උප සභාපතිතුමා, ධනංජය මන්ත්‍රීතුමා, තරංග මන්ත්‍රිතුමා අපි සියලු දෙනාම කතා කරපු දේවල් මේ සභා වාර්තාවේ ලියවිලා ඇති. නමුත් අපට ඒ වෙනුවෙන් කිසිදු විසඳුමක් ගන්න බැරි වුණා. ඒ මහත්වරුන් සමඟ කතිකා කළා. කිසිම තැනකදී විසඳුමක් ආවේ නැහැ. හැබැයි මෙතනදි මම දැක්ක දෙයක් තමයි. වැවිලි සමාගමට වැවිය යුතු වතුකරයේ තිබෙන

හෙක්ටෙයාර ගණනින්, 8%ක ප්‍රමාණයක් අභිබවා ගියපු නිසා තමයි මේ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වෙලා තියෙන්නේ. නමුත් අපිට මෙන්න මෙතනදී ඔවුන්ට දන්වන්න හැකියාවක් තියෙනවා. මේ කර්මාන්ත ශාලාව, විදේශ රටකින් යම්කිසි බලවේගයක් තුළ නැවත නිෂ්පාදන ධාරිතාවය වැඩි දියුණු කිරීමට උත්සාහයක් දරනවා. ඒක නවත්වන්න පුළුවන් නම් වඩා වැදගත් වෙනවා. මේ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඔබතුමා මේ කලාපයේ ප්‍රධාන නියමුවා හැටියට ඔබතුමාට පුළුවන් ඒ දේ කරන්න. මොකද කර්මාන්තශාලාවේ ධාරිතාව වැඩි කරනවානම්, එතනදි ඔබතුමාගේ අවසරය ගන්න වෙනවා. එහෙම නැති වෙනවා නම් ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරමින්, ඉදිරි අනාගතයේදී නාගොඩ ප්‍රාදේශීය සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට මේ රටට හොඳ දෙයක් කරන්න පුළුවන් මන්ත්‍රී පිරිසක් බවට පත්වෙන්න වාසනාව, ශක්තිය, ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු මන්ත්‍රීවරුනි, මම මේ කල්පනා කලේ, මට ඇලඩින්ගේ පුදුම පහන තිබුන නම් හොදයි කියලා. එතකොට මට මේ සියලුම ඉල්ලීම් ඉටු කරන්න තිබුනා. ඒ වගේම මම පළමුවෙන්ම අපේ වනිගරත්න මන්ත්‍රීතුමා අසනීපව රෝහල් ගතවී ඇති බැවින් ඔහුගේ නිවාඩු අනුමත කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට පිටතින් ගෙන එන ගොම ප්‍රශ්නය පිළිබඳව කතා කරනවා නම්, නාකියදෙණිය වත්තේ රබර් කර්මාන්ත ශාලාව ළඟ ගෙනත් දමා, පසුව කටු පොල් ගස් වටේ කාණු කපලා කාණුවලට දාලා වසා දමනවයි කියලා තමයි කටුපොල් කර්මාන්තශාලාවෙ නිලධාරීන් ප්‍රකාශ කරන්නෙ. කර්මාන්තශාලාවේ ධාරිතාවය වැඩි කිරීම පිළිබඳව කටු පොල් කර්මාන්ත ශාලාව විසින් අපිට තවම ඒ පිළිබඳව දැනුම් දීමක් කරල නැහැ. අපේ ධර්මසිරි මන්ත්‍රීතුමා කිව්වා වගේ, කටු පොල් කුණුවීම සහ වැටුප් නොගෙවීම සේවකයන් හා පාලන අධිකාරියෙ ප්‍රශ්නයක්. පහුගිය දවස් වල බද්දේගම හාමුදුරුනමක් රිමාන්ඩ් කරලා තිබුණා. කටුපොල් විරෝධතාවයක් නිසා.

ඊළඟට දූරියන් ගහ ගැන කතා කළා. එම පැමිණිල්ලට 19 වැනි වතාවටත් ආවා කියලා කතිකාවතක් ආවා. ඒ අනුව අදාළ ආයතන සමඟ සාකච්ඡා කරලා, ඒ අදාල ආයතන වලට ලියුමක් යැව්වා. මොකද අනතුරුදායක ගහක් ආවම, අපි අදාල පාර්ශවයට ලියුමක් යවනවා. දින දාහතරක් ඇතුළත කැපුවෙ නැතොත්, දෙවනි ලිපිය යවනවා. ඊට පස්සේ සභාවෙන් කපලා ඒ යන වියදම ගන්න කියල තමයි නීතිය තියෙන්නෙ. එකේදි ඒ මුදල කොහොමහරි සභාවට දෙන්න ඕන. නමුත් මේ වනතුරු සභාවෙන් එවැනි කර්තව්‍යක් කරලා නැහැ. අදාල පාර්ශවයට කියලා ඒ අනතුර ඉවත් කරන්න තමයි ගොඩාක් උත්සාහ ගත්තේ. මේ දූරියන් ගහේ විශාලත්වය සහ කපා ගැනීමේ අපහසුතාවය උඩ, අදාල පාර්ශවය මේ ගහ කපන්න බැහැ කිව්වම, සභාවෙන් කපන්න ඕන. නමුත් අපට හැකියාව නොමැති නිසා අපි දැව කර්මාන්ත ව්‍යාපාරිකයෙකුට ඒ ගැන කිව්වා. එයා කැමති වුණත්, ඔහු ඒ කාර්යය සඳහා පරක්කු වෙනකොට, දෙවෙනි ව්‍යාපාරිකයන්ටත් කතා කලහම, එතුමා ගස අයිතිකරුට රුපියල් 50,000.00 කුත් දෙන්න පොරොන්දු වුණා. නමුත් ගහ කපලා ප්‍රවාහනය කරන්න ෆර්මිට් එක ගන්න ගියහම තමයි මේ ප්‍රශ්නය ඇතිවෙලා තියෙන්නේ. මොකද ප්‍රවාහනය කරන්න බැහැ. දිසාපතිතුමියත් එක්ක අපි කතා කළහම, එතුමිය ග්‍රාම නිලධාරීට කතා කළාට පස්සේ, ඒ ඉඩම LRC ඉඩමක්, කාටවත් අයිති නැහැ. ඊට පස්සෙ අපි කලේ LRC එකට ලියුමක් යැව්වා. එයාලා මේ වෙනකොට මං හිතන්නේ ගහේ තක්සේරුවක් කරලා වෙන්දේසි කරන්න තමයි හදන්නේ. නමුත් LRC වුනාට, ඒ ඉඩම භුක්ති විදින අය ගසට අයිතිය කියාපානවා. නමුත් ඉඩම ඒ අයට අයිති නැහැ. ඔප්පු දීලා නැහැ. ඔප්පුව LRC එක භාරයේ තියෙන්නෙ. LRC එකට පුළුවන් වෙන්දේසි කරන්න. විකුණන්න. ඒ අනුව කටයුතු කරන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා විසි වෙනි වතාවට ඒ ආච්චි අම්මට එන්න තියන්නේ

නැහැ. ඒ වගේම මේ සියළුම කාර්යයන් මට පමණක් කරන්න බැහැ. ඒ සඳහා ඒ අදාළ නිලධාරීන්ද වගකියන්න ඕන. නිලධාරීන්ට අවශ්‍ය සෑම පුහුණුවක්ම ලබා දුන්නත්, එයාල ගිහිල්ලා අන්තිමට කියන්නේ සභාපතිගෙන් අහන්න කියලා. ඉතින් සභාපතිට හැමදේම කරන්න බැහැ. ලේකම්තුමියගෙන් මම ඉල්ලනවා. මීට පසුව මේ සභාවේ වෙන යෝජනා සියල්ල ඔබතුමිය, ඒ අදාළ නිලධාරීන් යොදවලා, ඒ පිළිබඳව කටයුතු කරන්න. ඒකෙ තත්ත්වය විතරක් කියලා අපිව දැනුවත් කරන්න. මොකද මට හැම දෙයක් ගැනම අහ අහ යන්න බැහැ. මන්ත්‍රීවරුනුත් ඇවිල්ලා මේ අවශ්‍යතාවයන් ගැන සොයා බලන්න. ඒ වගේම කම්කරුවන් සියලු දෙනා එකතුවෙලා, සුමානයක් විතර උපකාර්යාලය සුද්ද කළා. මට එතනට වෙලා ඉන්නත් බැහැ. දැන් කියනවා උපකාර්යාලය අපවිත්‍රවෙලා කියලා. තල්ගස්වල පොළට ගිහිල්ලා බලන්න අවුරුදු ගානකින් පස්සේ එතන සුද්ද කළා. දැන් මන්ත්‍රීවරු 27 දෙනෙක් ඉන්නවා. ඉතින් මන්ත්‍රීතුමන්ලා වැඩිවන විට ප්‍රශ්නත් වැඩියි. අනික සේවකයන් පස් දෙනෙක්ගෙන් මම කොහොමද මේ වැඩ කරන්නේ. ඉස්සර මේ සභාවේ මිනිස්සු 20, 30 ක් විතර හිටියා. j.c.b. යන්ත්‍රයක් තිබුණා. ඒ වන විට සභාවෙ ආර්ථික තත්ත්වයත් යහපත් මට්ටමක තිබුණා. දැන් ආදායම් තත්වය බොහොම පහල මට්ටමක තියෙන්නේ. අපි ආපු මුල් කාලයේදී මුද්දර ගාස්තු ලක්ෂ 71ක් ලැබුණා. ඔබතුමාලා කිව්ව වගේ, මම එම මුදල නිකරුනේ වියදම් කළා නම්, මීට මාස තුන හතරකට උඩදීයි අපේ ආර්ථිකය දුර්වල වෙන්නෙ. ඒ නිසා ඒ මුදල බැලන්ස් කරගෙන ගිහිපු නිසා තමයි අද වුණත් මේ කර්තව්‍ය කරන්න පුළුවන් වෙන්නේ. මේ මුදල් මම ගෙදර ගෙනිච්චේ නැහැ. මම සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන්න ගත්තේ නැහැ. මගේ යම් යම් දීමනාවන් මම මෙච්චර කල් ගත්තේ නැහැ. සභාවෙන් කිව්ව නිසා තමයි වර්තමානයේ මම ඒ දීමනා ගත්තෙ. නැත්නම් මමත් මගේ දීමනාව ශිෂ්‍යත්ව වලට දීපු කෙනෙක්. මිනිස්සු අහනවා ආදාහනාගාරය පිළිබඳව. ළඟදීම ආදාහනාගාරය ඉදි කිරීමේ කටයුත්ත ඉටු කරනවා. මම සභාපති හැටියට ප්‍රදේශයට කුමක් හෝ යහපතක් කරන්න තමයි ඉන්නේ.

වීථි ලාම්පු ගැන කතා කළා. මම තවත් කෙනෙකු යොදවාගෙන ඒ කාර්යයන් කළේ සල්ලි තිබිලා නෙවෙයි. සමහර ස්ථානවල අවුරුදු ගණන් කෙරුණේ නැති වීථි ලාම්පු සකස් කරලා තියෙනවා. ඒ අතරෙ අපේ මන්ත්‍රීවරුන් අතන නැහැ, මෙතන නැහැ කිව්වම ක්ෂණිකව කරන්න බැහැ. ඒ වගේම විලමාවත පාර, මුලනෙ පාර, ගෝණදෙණියේ පාර, වැලිවිටිය පාර ආදිය ශුද්ධ පවිත්‍ර කිරීම් සිදු කළා. ඒ අතරේ පාසල්වලින්, පොලීසියෙන් යම් යම් ඉල්ලීම් කරනවා. අපි ඒවත් කරන්න ඕන.

ඒ වගේම අපි ආදායම වැඩි කර ගන්නේ කොහොමද? උඩුගම බහුකාර්ය මධ්‍යස්ථාන, යම් යම් ආයතන වලින් නොමිලේ ඉල්ලනවා. අදත් අධ්‍යාපන කටයුත්තකට ඒ මධ්‍යස්ථානය නොමිලේ ලබා දෙනවා. මධ්‍යස්ථානයත්, වතුර බවුසරයත් නොමිලේ තමයි දෙන්න වෙන්නේ. එහෙම නොදුන්නොත්, කලින් අය මෙන්න මෙහෙම උදව් කළා. දැන් අය උදව් කරන්නේ නැහැ කියලා කියාවි. අපිව පාවා දෙන උදවියත් ඉන්නවා. පහුගිය දවස්වලත් උඩවැලිවිටිතලාවේ අනතුරු ගහක් කපන්න කියලා ලිපි යැව්වම, එම අය මෙහි ඇවිල්ලා, අපි චන්දෙ කාලේ, කලේ මෙහෙමයි කියලා මට දොස් කිව්වා. මම කිව්වා මේකට දේශපාලනය ගාවගන්න එපා කියලා. අන්න ඒ වගේ ගොඩක් ප්‍රශ්න එනවා. අපේ සමහර මන්ත්‍රීවරු කියනවා. අනේ අපේ මිනිහෙක්. ඒ නිසා මේ වැඩේ කරලා දෙන්න කියලා. ඉතින් මම කොහොමද නීතිය ක්‍රියාත්මක කරන්නේ. නීතිය ක්‍රියාත්මක කරන්න යනකොට, සාධාරණය ඉෂ්ඨ කරන්න යනකොට, යම් යම් බාධක එනවා. මටත් පුළුවන් කෙලින් වැඩ කරන්න. නමුත් දෙගොල්ලන්ටම සාධාරණයක් වෙන්න කටයුතු කරන්න තමයි මම කොයි අවස්ථාවේදීත් උත්සාහ කරන්නෙ. ඒ වගේම පතිනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කල කාරණයේදී මම කිව්වා ප්‍රශ්නයක් නැහැ කියලා. දැන් ප්‍රශ්නය සභාවේ කතා කලහම තමයි අපට ඒ පිළිබඳ ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් වෙන්නේ. සභාවට පැමිණිල්ලක් කලහම, අම්මාද තාත්තද කියලා අදාලා නැහැ. නීතිය ක්‍රියාත්මක

කරන්න වෙනවා. ඒ වගේම අපට හිතු මතේ කරන්න බැහැ. ඒ නිසා ලිඛිතව හෝ මේ සභාවේ යෝජනා කරන්න. ඒ අදාල කටයුතු අපි කරන්නම්.

පොළේ හිඟන මිනිස්සු ඉන්නවා කිව්වා. අපට ඒ පිළිබඳව ක්‍රියා කරන්න අවශ්‍ය අදහස් යෝජනා දෙන්න. අපි ඒ මිනිස්සුන්ට ඉවත්වන්න කිව්වොත්, මිනිස්සු කියන්නේ අන්න සභාපති අරුන්ට මෙහෙමයි කළේ කියලා. ධනංජය මන්ත්‍රීතුමා කිව්ව වගේ කන්නැලියේ කුණු ගේන්න අපිත් කැමතියි. නමුත් ඊට පස්සේ කියාවි අනුන්ගෙ කුණු ගේනවයි, අපේ කුණු පාරෙ කියලා. කන්නැලියෙ කුණු ප්‍රශ්නයේදී අපි මුදල වැඩි කළා. නමුත් ඊට කලින් ඉදලා කුණු ගේන්නෙ නැහැ කියලා ඒ සේවකයන් කිව්වා. ඒ නිසා මේ ප්‍රදේශයේ කසල වුනත් අපට එකතු කරගන්න බැරි එකේ අපට එහේ කසල ගන්න එක කරන්න අමාරුයි. ඇප්තොප් වත්තට යන පාර කොන්ක්‍රීට් කරපු නිසා. පසුගිය දවස්වල තල්ගස්වල වත්තෙ තැනක් අරගෙන තමයි තල්ගස්වල පොළේ කුණු දැම්මෙ.

ඒ වගේම ප්‍රශ්න ගොඩක් තියෙන්නෙ උඩුගම. උඩුගම පිට්ටනියට පහුගිය දවස්වල කොටන් වගයක් දාලා, එතනත් ප්‍රශ්නයක් ඇති වුණා. එතන රඟහල ඇත්තටම අබලන්වෙලා. දොරවල් මුකුත් නැහැ. මේක අද ඊයේ සිදුවෙච්ච දෙයක් නෙවෙයි. මේ කටයුත්ත කරන්න නම් ලොකු මන්ත්‍රී ප්‍රතිපාදනයක් අවශ්‍ය වෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රි කෙනෙක්ගෙන් හරි, ඇමති කෙනෙකුගේ හරි, ප්‍රතිපාදන අරගෙන තමයි අපට ඒ කාර්යය කරන්න වෙන්නේ. ඒ වගේම එම පිට්ටනියේ පොලේ වාහන දානවා. ඒක නවත්තන්න නම්, වාහන ස්ථානගත කරන්න වෙනත් ස්ථානයක් දෙන්න ඕන. ඉතින් එසේ ස්ථානයක් ලබාදෙන්න පහසුකම් නැහැ. උඩුගම පිට්ටනියට ගේට්ටුවක් අත්‍යාවශ්‍යයි. ඒ වගේම උඩුගම නැගෙනහිර පෙර පාසලේ දෙමව්පියන් විසින් මුදල් එකතු කරලා ලයිට් ගන්න හැදුවා. අපි මැදිහත් වෙලා සභාවේ මුදලින් රුපියල් දහනම දාස් ගානකට ආසන්න ගණනක් වියදම් කරලා ලයිට් අරගෙන දුන්නා. ඒවගේම ඒ පෙර පාසලේ ලක්ෂ 05 ක් වැය කර සංවර්ධන කටයුතු කළා.

ඊළඟට අපේ මන්ත්‍රීතුමාලා කතා කළ සෑම දෙයක් ගැනම මම කතාකරන්න යන්නෙ නැහැ. පහුගිය දවස් වල පෙර පාසල් ළමයින්ගෙ උත්සවයක් කරන්න යම් ක්‍රමවේදයකට ආවා. ඉදිරියේදී මේ දේශපාලන වාතාවරණයත් සමග බොහෝ දුරට එය හිතපු ආකාරයට කරගන්න අපහසු වෙයි. මම හිතන්නේ ළමයින්ට සතුටු විය හැකි යමක් කළොත් මිසක්, අපි හිතපු ආකාරයට අපේ මුදල් වියදම් වෙන එකක් නැහැ. මොකද අප සතු මුදල් ඇත්තෙත් නැහැ. අපි පරිත්‍යාගශීලීන්ගෙන් පරිත්‍යාග අරගෙන දරුවන්ට හොඳ දෙයක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ආදාහනාගාරයේ මූලික කටයුතු අවසන් අදියරේ තියෙන්නෙ. ගුළුගහකන්ද ප්‍රදේශයේ ආදාහනාගාරය ඉදි කිරීමට අවශ්‍ය ඉඩම් කොටසක් වෙන්කර ගැනීම සම්බන්ධව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අපි ලිපි යැව්වට පස්සේ, එයට පිළිතුරු වශයෙන් ඇල්පිටිය වැවිලි සමාගමට අයත් භූමියෙන් අක්කරයක භූමි ප්‍රමාණයක් වන්දි ගෙවීමේ පදනමට යටත්ව ලබා දීමේ එකඟතාවය ලබා දී ඇති බැවින් වන්දි මුදල් ගෙවීම පිළිබඳ අපේ එකඟතාවය එවන්න කියලා ලියුමක් එවලා තිබුනා. නමුත් මම කිව්වේ එහිදී අපට වන්දියක් ගෙවන්න බැහැ කියලා. බොහෝදුරට වන්දි නොමැතිව අපට මේ ඉඩම ලබාගන්න පුළුවන් වේවි. මේ ඉඩමේ අයිතිය එනකම් කිසිම කටයුත්තක් කරන්න බැහැ. අයිතිය තියෙනවනම් තමයි රුපියල් ලක්ෂ 200 ක මුදල අපට ලැබෙන්නේ. අපට ලක්ෂ 200 ක් ලැබුනට, ලක්ෂ 258ක ඇස්තමේන්තුවක් තමයි සාදා තියෙන්නෙ. අඩු මුදල් හොයාගන්න ක්‍රමවේදයක් ඉදිරියෙදි සොයා ගමු.

ඊළඟට ජල යෝජනා ක්‍රම පිළිබඳව කතා කළා. නාගොඩ ඉහළ සහ උනන්විටිය ලක්ෂ 240 ක ජල යෝජනා ක්‍රම දෙකක් යෝජනා වෙලා තියෙනවා. ඒ මුදල් සභාව හරහා යන්නේ. සභාවේ අධීක්ෂණයෙන් සිදුවෙන්නෙ. සභාවට සල්ලි දෙනවා කිව්වා. ඒවායේ ව්‍යාපෘති වාර්තාවල යම් යම් අඩුපාඩු තියෙනවා කියලා නැවත එව්වා. නැවත ව්‍යාපෘති වාර්තා හදලා යවන්න ඕන. ඉතින් මේ කටයුතු තමයි අපි කරන්නේ. අපි කොයිවෙලෙත් බලන්නේ කුමක් හෝ දෙයක් කාට හෝ යහපතක්

වන දෙයක් කරන්න. ඒක නිසා මමත් මේ අපේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් හරි වර්තමාන ආණ්ඩුකාරතුමාගෙන් හරි මුදල් ප්‍රතිපාදන වෙන් කරගැනීමේ හැකියාව තියෙනවා නම්, ඒ කටයුතු කරන්න කියලා. මම හිතන්නේ ඉදිරි දිනවල දේශපාලනික වශයෙන් යම් යම් වෙනස්කම් ඇති වේවි. කොහොම නමුත් මොන දේශපාලන පක්ෂ, මතිමතාන්තර දැරුවත්, අපි සියලු දෙනා සහෝදර ලීලාවෙන් තමන්ගේ දේශපාලන පක්ෂයක් එක්ක බැඳිලා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕන. පසුගිය දිනක අපි කිලිනොච්චිය ප්‍රදේශයේ සංචාරය කළා. එහිදී මහින්ද ජනාධිපතිතුමා හදපු පාසල් , රෝහල්, මාර්ග පෙන්වමින් හැමෝම කිව්වේ මහින්ද මහත්මයා තමයි හොඳ කියලා. අන්න එවැනි වාතාවරණයක් තමයි මේ රටේ තියෙන්නේ. නාගොඩ ප්‍රාදේශීය සභාව හැටියට අපි සියලු දෙනා එකතු වෙලා කටයුතු කරනවා නම් හොඳයි. අපට ආර්ථික තත්ත්වය අයහපත් නිසා තමයි අඩුපාඩු තියෙන්නෙ. අපට සියලු දෙනාම සතුටු කරන්න හැකියාවක් නැහැ. කොහොම නමුත් මම ඒ කටයුතු යහපත් ආකාරයට කරනවා. එහෙම නම්, මම මීට වඩා යමක් කියන්නේ නැහැ. මගේ කතාවත් ටිකක් සැර වුණා නම් අපේ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඒ ගැන වරදවා හිතන්න එපා. ආතතිය නිසා තමයි මෙහෙම වේදනාවෙන් කතා කරන්නෙ. එහෙම නම් එළැඹෙන සභා වාරයේදී, අපි මේ කියපු කාරණා සාකච්ඡා කරලා විසඳගන්න බලමු. ඒ වගේම හෙට අපේ සභාව විසින් මෙහෙයවන බෝධි පූජා පින්කමක් ප.ව. 7.00 ට නාගොඩ විජිතාරාම විහාරස්ථානයේ පැවැත්වෙනවා. ඒ සඳහා සියලුම දෙනා සහභාගි වෙන්න කියලා ආරාධනා කරමින්, සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ඔබ සැමට බොහොම ස්තුතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:- ..............................